

ශ්‍රී කාලිදාස මහා කවීන් විරචිත

# ශකුන්තලා

ලිහිණි පොත්

16

මහාකවි කාලිදාසයන් ගේ

# සකුන්තලා

G. ...SON
HEADQUARTERS SCOUT COMMISSIONER
173, L. E. PERERA MAWATHA,
MAGALLE - GALLE.

ඇම්. සිරිසුමන



මහාකවි කාලිදස ගේ

# අභිඥාන ශාකුන්තලා

සහ භාෂගේ

# ස්වප්න වාසවදත්තා

මාවුස්සාගොල්ලේ සිරිසුමන හිමි



ලිහිණි පොත්
සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම
කොළඹ

# කාලිදාස හා ශාකුන්තලය

ශාකුන්තලය ඉන්දියානු නාට්‍ය සාහිත්‍යයේ මුදුන් මල හැටියට විචාරකයෝ සළකති. ලොව මුළුල්ලෙහි කාලිදාසගේ කීර්තිය ගෙන ගියේ මේ ශාකුන්තලයයි. බටහිර සාහිත්‍ය රසිකයන් පැරණිම ඉන්දියානු නාට්‍යය වශයෙන් දුටුවේ මහා කවි කාලිදාසයන් කීර්තිමතෙකු බවට පත්කළ මේ ශාකුන්තලයයි. සර් විලියම් ජෝන් මහතා 1789 යෙහිදී මේ නාට්‍ය කෘතිය ඉංග්‍රීසියට පරිවර්තනය කිරීමෙන් පසු සෙසු බටහිර සාහිත්‍ය රසිකයෝද ශාකුන්තලයෙහි රස උරා බොන්නට යත්න කළහ. ජර්මන් බසටද, ප්‍රංශ බසටද, ඩෙන්මාර්ක් බසටද, ඉතාලි බසටද නොබෝ කලකින් ශාකුන්තලය පරිවර්තනය වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

ශාකුන්තලයෙන් හා කාලිදාසයන් විසින් ලියූ වෙනත් නාට්‍ය කෘති රැසකින්ම සංස්කෘත සාහිත්‍ය සැරසෙයි. එහෙත් කාලිදාසයන්ගේ ප්‍රතිභාවයත්, චින්තන ශක්තියත්, කලාත්මක කෞශල්‍යයත්, නීති නෛපුණ්‍යයත්, පැහැදිලිව පිළිබිඹුවන්නේ ශාකුන්තලයෙහිය. මෙහි එන කතා සාරය පාරම්පරික හැඟුම් ගැබ්වන වෘත්තාන්තයක් වුවද වෛදිකා ගතවන හැම මොහොතකම සෑම නව්‍ය නාට්‍ය කෘතියකටම මග පෙන්වන්නෙක් වෙයි.

**ශාකුන්තලයෙහි පිළිබිඹුවන කාලිදාසයන්ගේ මහිමයක් නම් බටහිර මිනිසුන් දහනවවැනි ශතවර්ෂය වන තුරුත් අවබෝධ නොකරගත්, ඇතැම් කරුණු පහළොස්වැනි ශතවර්ෂයේ ජීවත් වුනු කාලිදාස විසින් අවබෝධ කරගනු ලැබීමයි.**

ශාකුන්තලයෙහි පසුබිම පෙම් පුවතක් බව සැබෑය. එහෙත් ඔහු මේ නාට්‍යය රචනා කර තිබෙන්නේ සෙසු සාහිත්‍ය රසයන්ටද ඉඩකඩ තබමිනි. දෛවයෝගය හා අහම්බ සිදුවීම් මෙහි සුලබ වෙතත් එහි අපවාදය හිමිවන්නේ කාලිදාසට නොව එකල සමාජයටය. සමාජයක බලපාන කරුණු සාහිත්‍ය කෘතීන්හි පිළිබිඹු වීම නොවැළැක්විය හැකිය.

අංක සතකින් යුක්ත ශාකුන්තලයෙහි ආවේග බහුල අංකයන් අතර හතරවෙනි අංකය මුල් තැන ගනී. මේ නාට්‍යය කෘතිය විචාරාත්මකව කියවන්නකුට හතරවෙනි අංකයෙහිදී ඇති වන්නේ ශොකප්‍රවාහයකි–කඳුළු ධාරා වගුරුවන හැඟුමෙකි. උණුසුම් සුසුම් හෙළුමකි. මේ අංකයෙහි එන පහත සඳහන් පද්‍යයයෝ බටහිර සාහිත්‍ය විචාරකයන්ගේ වර්‍ණනයටද, රසාස්වාදයටද, සමාලෝචන–යටද ලක් වූහ.

''පාතුං න ප්‍රථමං ව්‍යවස්‍යති ජලං යුෂ්මාස්වපීතෙෂුයා,
නාදත්තෙ ප්‍රියමණ්ඩනාපි භවතාං ස්නෙහෙනයා පල්ලවම්.
ආද්‍යෙවඃ කුසුමප්‍රසූති සමයෙ යස්‍යා භවත්‍යුත්සවඃ
සෙයංයාති ශකුන්තලා ප්‍රතිගෘහං යචෛරනුඥයතාම්.''

''අනුමත ගමනා ශකුන්තලා–තරුභිරියං වනවාසබන්ධුභිඃ
පරභෘත විරුතංකලං යථා–ප්‍රතිවචනීකෘත මෙභිරීදෘශම්.''

''රම්‍යාන්තරඃ කමලනී හරිතෛඃ සරොභිඃ
ඡායාද්‍රැමෛඃ නියමිතාර්ක මයුඛ තාපඃ
භූයාත්ශෙශය රජො මෘදු රෙනුරස්‍යාඃ
ශාන්තානුකූලපවනශ්ච ශිවශ්ච පන්ථාඃ''

—ළදරු කාලයේ පටන් ඇති දැඩි කරගත් පෙම්බර දියණියකු වෙන්ව යන විට ආදරණීය මවෙකු ගේ හෝ පියෙකු ගේ හෝ හදවතෙහි ජනිත වෙන ශෝකාත්මක හැඟුම් කෙබඳු ද යන්න විදහා දක්වමින් කාශ්‍යප සෘෂිවරයාගේ මුවට නැංවෙන, කරුණා රසයෙන් කුළු ගැන්වුන හැඟුම් මේ පද්‍යයන්හි එයි. (හතර වන අංකය කියවන්න.)

ශාකුන්තලයෙහි හය වෙනි අංකයෙන් මහා කවි කාලිදසයෝ උපහාසාත්මකව සමාජය දෙස බලති. ඔහු උච්ච සමාජයට උපහාස කරවන්නේ එකල සමාජය විසින් සැළකූ පහත් පඞක්තියේ මිනිසෙකු ලවා ය. බමුණෙකුට – බමුණෙකු විසින් පහරදීම උපහාසයක් නොවන්නේ ය. බමුණෙකුට මසුන් මරන්නෙකු ලවා කාලිදස උපහාස කරවන්නේ එහෙයිනි. (හයවන අංකය බලන්න.)

මේ නාට්‍යය කියවීමෙහිදී පාඨකයාගේ පහසුව සඳහා ශාකුන්තලයේ කථා සාරය මෙසේ යොදමු.

විශ්වාමිත්‍ර නමැති තවුසෙකු නිසා තම කුස උපන් ලේ කැටි ළදැරිය වනයෙහි ගසක් මුල දමා මේනකා දෙව් ලොවට ගියාය. පක්ෂීන් විසින් වට කරනු ලැබ සිටි මේ ළදැරිය කාශ්‍යප තවුසා විසින් පොෂිත කරනු ලැබුවාය.

හස්තිනා පුර චන්ද්‍ර වංශයට අයත් දුෂ්‍යන්ත නම් රජෙක් වෙයි. හේ දිනක් දඩයමට ගොස් මුවකු දැක ඌ පසුපස්සේ එලවා යන්නේ කාශ්‍යප නම් මහා තවුසකු ගේ ආශ්‍රම ප්‍රදේශයට ළඟා වෙයි. මුවා ආශ්‍රමයට අයත් වන ප්‍රදේශයෙහි මුවෙකු බැවින් මෙය දුටු තවුසෝ අභයස්ථානයට අයත් මුවන් නො මරණ ලෙස රජුගෙන් ඉල්ලා සිටියහ. රජු දුනු හී බිම දමා තවුසන් ගේ ඉල්ලීමට කීකරු විය. ඉන් පසු පිපාසයෙන් පීඩිත වූ රජු ජලය සොයනු සඳහා ඒ මේ අත බලන්නේ ඈත තවුස් අරම ඉදිරිපස ඇති වෘක්ෂලතාවන්ට ජලය ඉස්නා ගස්පොතු වලින් තැනූ වස්ත්‍ර හැඳගත් එහෙත් දෙවඟනන් වැනි රූ සපු-වෙන් යුත් තවුස් තරුණියන් තිදෙනෙකු දකියි. ඒ තිදෙන අතර වූ එක් තරුණියක් දුටුවන් වශී කරවන සුළු රූපශ්‍රීයෙන් යුක්ත වූවාය. රජු ගේ නෙත හා සිත ඇය දෙසට යොමු විය. ඕ නමින් සකුන්තලා ය. අනෙක් තවුස් තරුණියන් දෙදෙනා ප්‍රියංවද හා අනසූයා ය. රජු ගසකට මුවා වී මේ තරුණියන් දෙස බලා ගෙන මොවුන් සමග කථා කරන්නට අවසරයක් ලැබෙනතුරු නො ඉවසිල්ලෙන් සිටියි.

මී මැස්සෙක් සකුන්තලාව ගේ රුමත් මුහුණ පියුමකැයි රැවටී එය වටේ කර කැවෙන්නට විය. සකුන්තලා මී මැස්සා තම මුවට අනිය යන බියෙන් ඌ පලවා හරින්නට තැත් කර යි. රජු මෙය දැක වහා පැමිණ මී මැස්සා පලවා හරියි. මේ සිද්ධිය රජුට සකුන්තලා සමග කතා කිරීමට හොඳ අවස්ථාවක් විය. රජු ඇගේ වත ගොත ආදි සියල්ල විමසුවේ ය.

මේ දිනවල තවුස් අරමෙහි ප්‍රධානියා වූ කාශ්‍යප මහා තවුසා අරමෙහි නැත. ඔහු යාග කර්මයක් සඳහා සෝමතීර්ථ නම් ප්‍රසිද්ධ පුණ්‍යතීර්ථයට ගොසින් ය. ඔහු ආපසු එන්නේ සමසකට පසු ය. කෘතිම විලාසිතා නැති සකුන්තලා ගේ ස්වාභාවික අනුපමේය රූප ශ්‍රියෙන් වශීකෘත වූ දුෂ්‍යන්ත රජු සකුන්තලා සමග කළ ස්වල්ප පිළිසඳර කතාවෙන් පසු වනාරාම සීමාව ඉක්මවා ගොස් ස්වකීය මිත්‍ර විහිළුකාර විදූෂක හමු විය. හමු වී මේ පුවත කීය. රජුට මුව දඩයමත්, රාජ්‍යයත්, අන්තඃපුර ස්ත්‍රීනුත් යන සියල්ල ම සකුන්තලා ගේ දර්ශනවීමෙන් පසු අමතක විය.

පසු දින ද එහි යන්නට සැරසෙත් ම වහාම මාලිගයට එන ලෙස මවු බිසවගෙන් හස්තිනා පුර සිට පණිවුඩයක් ලැබුණි. මව ගේ අණට කීකරු විය යුතු ද නැතහොත් සකුන්තලා දැකීමට අසපුවට යා යුතු ද යනු දැන් රජු ඉදිරි යෙහි ඇති ප්‍රශ්නයයි. රජු තම මිත්‍ර විදූෂක මව ගේ පණිවුඩයට යවා තෙමේ අසපු පෙදෙසට ගියේ ය.

වනයේ ඉපිද වනයේ ම වසන සකුන්තලා ආලයේ රසක් තබා ආලය යන වචනයවත් අසා පුරුදු නැත. එහෙත් පෙර දින රජු දුටු වේලේ පටන් ඇය ගේ සිත රජු කෙරෙහි ඇදී ගොස් ය. ඇය ගේ මිතුරියන් දෙ දෙනා ප්‍රියංවද සහ අනසූයා දැන් ඇයට රජු ගැන කියමින් විහිළු-තහළු කරති. ආලයෙන් මත්ව මිලාන වූ සකුන්තලා සනසනු සඳහා මිතුරියන් දෙ දෙනා ලතා මණ්ඩපයක් යට අසුනක් තනා එහි මල් අතුරා සකුන්තලා ඒ මත සතපවති. එවිට රජු එ තැනට පැමිණෙයි. ඔහුට ඇය සමග සිත් සේ කථා කරන්නට ඉඩ දී යෙහෙළියන් දෙ දෙන එ තැනින් මගහැර යති. මේ අයුරින් දින කීපයක් ගත විය. අන්තිමේ දී ගාන්ධර්ව විවාහ ක්‍රමය අනුව විවාහ වෙති. ඉන්පසු රජ තම අතේ ඇති පේරැස් මුද්ද සකුන්තලාට දී ඇය කැඳවාගෙන යනු සඳහා රජ පිරිස එවන බව කියා ආපසු තම නුවරට යයි. සකුන්තලා ප්‍රිය විප්‍රයෝගයෙන් තැවෙමින් අසපුවේ සිටියි.

G. WINDSOR
COMMISSI
L. E. PERERA MAWATHA,


මේ අතර දුර්වාස නමැති තවුසෙක් අසපුවට එයි. ඔහුට ආගන්තුක සත්කාර කිරීම වියොග දුකින් පෙළෙන සකුන්තලාවට අමතක වෙයි. තවුසා කිපී ඇයට ශාප කොට යයි. තවුසා සෝමතීර්ථයේ සිට පස්සේ දුවගොස් සකුන්තලා වෙනුවෙන් සමාව අයදියි. "සිහිවීමේ ලකුණක් පිළිබඳ ආභරණයක් දැකීමෙන් ශාපය මඟහැරේ" යයි කියා දුර්වාස නික්ම යයි.

නිම වූ යාග කම් ඇති කාශ්‍යප තවුසා සෝම තීර්ථයේ සිට සමසකට පසු අසපුව කරා එළඹෙයි. විවාහය පිළිබඳ පුවත පිය තවුසාට කීමට බියෙන් සකුන්තලා සහ ඇගේ යෙහෙළියන් තැවෙති. මහා නුවණ ඇති තවුසා අසපුවට එත්ම මඟදීම සිය දියණිය දුෂ්‍යන්ත රජු වෙනුවෙන් ගැබ් ගෙන සිටින බව දැන ගනියි. දැන ඉතා ප්‍රීතිව සැමියා වෙත යැවීමට සූදානම් කරයි. ඒ පිළිබඳ යාග හෝම විධි පවත්වා අසපුවේ වසන සිය ගණනක් තවුස් තවුසියන් ගෙන්වා සැමියාගේ නිවසේ දී පිළිපැදිය යුතු සැටි විස්තර කරමින් අවවාද කරයි. විවාහක ස්ත්‍රියක් සැමියා සිටිය දී මවුපියන් ගේ ගෙදර සිටීම නුසුදුසු බව පවස යි. ගෞතමී නමැති තලතුනා තාපසියක් සාරංගරව හා සාරද්වත නමැති තරුණ තාපසයන් දෙ දෙනාත් අමතා සකුන්තලා හස්තිනා පුරයට කැඳවාගෙන යන ලෙස නියම කරයි.

සකුන්තලා පිය තවුසා වැළඳගෙන හඬයි. පිය තවුසා ද දෙනෙතින් ඇගේ හිස උඩට කඳුළු ධාරා වගුරුවයි. ඇගේ යෙහෙළියෝ ඉකි බිඳිමින් හඬති. අසපුවේ වන උයනේ වසන මුව, ගෝන ආදී සත්තු ද ගිරා, මයින, කෝකිළා දී පක්ෂීහු ද, සිය යෙහෙළිය ගේ වියෝගය දැක හඬන්නට වන් හ. සකුන්තලා විසින් ජලය වත් කොට හැදූ වැඩූ තුරුලිය ද හඬන්නට වන්හ. මුව පැටියෙක් පැමිණ ගමන් ගත් සකුන්තලා ගේ වස්ත්‍ර කොනින් අදියි. සකුන්තලා දෙනෙතින් කඳුළුධාරා වගුරුවමින් උගේ ඇඟ පිරිමැද නවතින්නට කියයි.

ප්‍රියංවද හා අනසූයා ද හොඳින් සොයා බලා ගන්නා ලෙස පිය තවුසාට සකුන්තලා කියයි. හැම දෙනාගෙන්ම සමු ගෙන පියාණන් තවුස් තවුසියන්, වන සතුන් කුරුලියන් හඬවමින් සකුන්තලා ආශ්‍රම සීමාව ඉක්මවා පිරිවර තිදෙනාත් සමග නුවර බලා යයි.

අතරමග තොටපළක දී සකුන්තලා ජලස්නානය කරයි. එහි දී තමා නො දැනීම තම ඇඟිල්ලේ ඇති පේරැස් මුද්ද ගිලිහී වැටෙයි. එය මහ මාළුවෙක් ගිලියි. සකුන්තලා පෙරටු කොට ඇති ගෞතමී, සාරංගරව හා සාරද්වත යන තවුස් පිරිස නගරයට ගොස් රජු බැහැ දකියි. රජු ගේ බිරිඳ වූ සකුන්තලා පිළිගන්නා ලෙස ඔවුහු කියති. දුර්වාස තවුසා ගේ ශාපය නිසා රජුට සකුන්තලා හැඳින ගත නො හැකි වෙයි. එ වැනි බිරිඳක් තමාට නැති බවත්, බොරුකාර ස්ත්‍රීන්ට තමා නො රැවටෙන බවත් රජු කිය යි. තවුසන් කරුණු පැහැදිලි කළ නමුත් රජු එය නො පිළි ගනියි. රජුට තදින් දෙස් කියා ගෞතමිය හා තවුසන් දෙ දෙනා සකුන්තලා සිටියදී යති. ඇය තම දෛවයට දෙස් කියමින් ඉකි බිඳිමින් හඬයි. පුරෝහිත බමුණා ඇය තම නිවසෙහි නතර කර ගනු සඳහා කැඳවාගෙන යයි. ඇයට වූ ඇබැද්දිය ගැන අහස දෙසට දෑත දිගු කොට දෙවියන්ට කියමින් යද්දී ඇගේ මව වූ මේනකා දෙවඟන අහසින් අවුත් ඇය අතුරුදහන් වූ බව රජුට දන්වයි. රජ බිය වෙයි. දුක්වෙයි. තැවෙයි.

සකුන්තලා අතින් එද ගිලිහුණු පේරැස් මුද්ද ගිලින ලද මත්ස්‍යයා මස් මරන්නෙකුට අසුවී ඔහු ඌ කපද්දී මුද්ද දකියි. ඔහු එය ගෙන ගොස් විකුණන්ට තැත් කරද්දී පොලිස් භටයෙකුට අසුවෙයි. රජු ගේ නම කොටා ඇති මුද්ද දුටු පොලිස් භටයා ඔහු අල්ලා තලා පෙළා ගෙන ගොස් පොලිස් නිලධාරියාට භාර දෙයි. පොලිස් අධිපතියා පොලිස් භටයන් දෙදෙනෙකුත් සමග මස් මරන්නා ගෙන රජු ඉදිරියට යයි.

රජුට මුද්ද දකිත් ම සකුන්තලා සිහි වෙයි. මස් මරන්නාට මුදල් පසුම්බියක් දෙයි. ඔහු ඉන් කොටසක් පොලිස් කාරයන්ට දෙයි. පොලිස් භටයෝ ඔහුත් සමග තැබැරුමට ගොස් රා බොති.

අවුරුදු තුනක් පමණ ගත විය. සකුන්තලා දැන් මරීචි නමැති තවුසා ගේ අසපුවේ ය. ඇයට තුන් අවුරුදු වයසැති පුතෙක් සිටී. මේ කුමරා අසපුව අසල වසන සිංහ ව්‍යාඝ්‍ර පැටවුන් සමග කෙළි දෙළෙන් කල් යවයි.

දිනක් මේ පෙදෙසට ආ දුෂ්‍යන්ත රජුට සිංහයන් සමග ක්‍රීඩා කරණ කුමරා හමුවෙයි. දුටු හැටියේ ම තම පුතා යයි හැඟීමක් හටගනියි. රජු සකුන්තලා දැක හැඳින ගනියි. පුත් කුමරා වැළඳ ගනියි. රජු සකුන්තලා ළඟ ඇද වැටී සමාව යැද කුමරාත්–සකුන්තලාත් කැඳවාගෙන මාලිගයට ගොස් සකුන්තලා අග මෙහෙසිය කරයි. කුමරා පසු කලෙක බලවත් අධිරාජයෙක් වී සර්ව දමන නොහොත් –භාරත නමින් හැඳින් වෙයි.''

ශාකුන්තලය හා වාසවදත්තා සිංහලට නැඟීමෙහි දී අප අනුගමනය කළේ පදනු පදික පරිවර්තන ක්‍රමය නොවේ. කවර භාෂාවක නමුත් කෘතියක් තවත් බසකට නැඟීමෙහි දී එහි රසය ගිලිහී යාම නො වැලක් විය හැකි පරිදි සිදු වන්නේ ය. විශේෂයෙන් සංස්කෘත නාට්‍යයක් පරිවර්තන කිරීමෙහි දී එය බොහෝ සෙයින් සිදුවෙයි. වාසවදත්තා හා ශාකුන්තලය සිංහල අනුවාද කිරීමෙහි දී එහි ප්‍රස්තාවනා බැහැර කළ බව අවසාන වශයෙන් සඳහන් කරමු. ශාකුන්තලය හා ස්වප්න වාසවදත්තා පරිවර්තනයෙහි දී අපට බෙහෙවින් උදව් දුන් උගතුන් අතර පෙර'පර දෙ දිග නාට්‍ය කලා පිළිබඳ ගවේශණාත්මක බුද්ධියක් ඇති ලංකා විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය ඊ. ආර්. සරච්චන්ද්‍ර සූරීන්ද, කුඩා උඩුවේ නාලන්ද විද්‍යාලීය ඌරාපොල හෙමාලෝක හිමියන්ද ලංකා විශ්ව විද්‍යාලීය හෙම්පාල විජයවර්ධන මහතාද සිහි කරන්නේ කෘතඥතාවයෙනි.

මාවුස්සාගොල්ලේ සිරිසුමන

25–8–54

## සකුන්තලාවෙහි සඳහන් ප්‍රධාන නළු නිළියෝ

1 දුෂ්‍යන්ත රජු.
2 රථාචාය්‍ය‍්‍යයා.
3 ශිෂ්‍යයෙක්.
4 සකුන්තලා.
5 අනසූයා.
6 ප්‍රියංවද.
7 විදූෂක.
8 දෙරටු පාලයා.
9 සෙනා පති.
10 සෘෂි කුමාරයන් දෙදෙන.
11 රාජකීය පණිවුඩකාරයා.
12 ගෞතමී.
13 කාශ්‍යප
14 සාරංගරව.
15 සාරද්වත.
16 ඇමති.
17 ද්වාර පාලි.
18 පුරොහිත බමුණා.
19 නගර පරික්ෂක.
20 ආරක්ෂක භටයෝ දෙදෙන
21 මාතලී.
22 දුර්වාස.
23 දරුවා (දුෂ්‍යන්තගේ පුත්‍රයා)

# සකුන්තලා

## 1. වන අංකය

(දුෂ්‍යන්ත රජතුමා රියක නැඟී මුව දඩයමෙහි යයි)

රථාචාර්යයා: "රජතුමනි! රජතුමනි!

අර–අර–මුවෝ–මුවෝ"

රජු: "හා අප මෙපමණ දුරට ඇදගෙන අවුත් තිබෙන්නේ මේ මුවන් විසින් නොවැ. මේ රථය දැක මුවෙන් ඩැහැගත් ළ–පලු පවා අත හැර මේ මුවන් වේගයෙන් දුවන හැටි"

රථාචාර්යයා: "ඒක තමයි දේවයිනි, ඒක තමයි රජතුමනි, මේ රථයෙහි වේගය අඩු කරමින් ගමන් කෙළේ. එසේ වුනත් ඔවුන් ළංකිරීම එතරම් පහසු වැඩක් නොවේ."

රජු: "එහෙනම් අපි මෙතකින් රථය නවත්වමු."

රථාචාර්යයා: "හොඳමයි දේවයන් වහන්ස!"

(රථය ගමන් කරණ වේගය දක්වමින්) රජතුමනි! රජතුමනි! රියෙහි රුහැන බුරුල් කරද්දීත් කන් ඔසොවාගෙන සූර්යදේවයාගේ අශ්වයන් මෙන් මේ අශ්වයන් දුවන හැටි බලන්න."

රජු: "ඇත්ත තමයි රථාචාර්යය"

රථාචාර්යයා: "මේ අසපුවක් වගෙයි."

රජු: (වේගයෙන්) "නවත්වන්න, නවත්වන්න රථය"

රථාචාර්යයා: "හොඳමයි, හොඳමයි."

(ශිෂ්‍යයෝ තිදෙනෙක් පැමිණෙති)

ශිෂ්‍යයෙක්: (අත ඔසවා ආචාර කරමින්) "රජතුමනි, මේ ආශ්‍රමයේ ජීවත්වන මුවන් මරන්න එපා, මරන්න එපා, ඔය ඊතල, කොපුවෙහි රුවා ගනු මැනවි. ඔබ වැන්න වුන්ගේ ආයුධ තිබෙන්නේ අහිංසකයන්ට පීඩා කිරීමට නොවේ. අහිංසකයන් පීඩාවන්ගෙන් රැක ගැනීමටය ඔබ වැන්නවුන්ට ආයුධ අවශ්‍යවන්නේ."

රජු: "හොඳයි! හොඳයි! මෙන්න ඒ ඊතලය කොපුවෙහි තැන්පත් කරගත්තා."

අනෙක් ශිෂ්‍යයන් දෙදෙනා: (අත් ඔසවා ආචාර කරමින්) "සැබවින්ම ඔබතුමා සක්විති පුතෙකු වගෙයි."

රජු: "ඔබගේ ආචාරය ගෞරවයෙන් පිළිගනිමි."

තුන්වෙනි ශිෂ්‍යයා: 'රජතුමනි, අප මෙහි පැමිණියේ දර කැඩීමටය. මාලිනී තීරයෙහි පිහිටි මේ අසපුව "කන්ව ස්‍වාමිවරයාට" අයත් වූවකි. එහි පැමිණ ආගන්තුක සත්කාර පිළිගනු මැනවි."

රජු: "මහර්ෂිතුමා එහි වැඩ සිටිනවා ද?"

තුන්වෙනි ශිෂ්‍යයා: දැන් එහි මහර්ෂි තුමා නම් නැහැ. එතුමා සෝම තීර්ථයට ගොසින් එසේ වුනත් ආගන්තුක සත්කාරයට දැන් එතුමාගේ ආදරණීය දියණිය වූ සකුන්තලා එහි ඉන්නවා."

රජු: "හොඳයි. එහි ගියොත් සකුන්තලාත් දැක ගත හැකි. ඇය මා ගැන මහර්ෂි තුමාට කියාවි."

තුන්වෙනි ශිෂ්‍යයා: "එසේ විය හැකියි රජතුමනි," (ශිෂ්‍යයෝ නික්මයති.)

රජු: "රථාචාර්‍යය, මේ පුණ්‍යා'ශ්‍රමයට ගොස් එහි ඇති පිවිතුරු බව දකිමු."

රථාචාර්‍යයා: "හොඳමයි දේවයන් වහන්ස," (යළිත් රථය වේගයෙන් ගමන් කරයි.)

රජු: (වට පිට බලමින්) "රථාචාර්‍යයා පෙර මෙහි නො පැමිණියත් මෙහි තවුසන් සිටින බව අපට ඉබේටම දැනෙයි."

රථාචාර්‍යයා: "ඒ කොහොමද? දේවයන් වහන්ස, ඇයි පේන්නේ නැද්ද? ඔබට මේ ගිරවුන් සිටින ගස්වලින් වැටුන හැල්කරල්. ඇයි පේන්නෙ නැද්ද සුව පහස් දෙන දිලියෙමින් තිබෙන මේ ගල්තලා, ඇයි පේන්නෙ නැද්ද මේ රියෙහි සක්හඬට බිය නොවී හීලෑ වූවන් මෙන් සිටින මේ වන සිවුපාවුන්. ඇයි පේන්නෙ නැද්ද කඳු රැලිවලින් ගලා බසින රිදී ධාරා වැනි මේ දිය පාරවල් ?"

රථාචාර්‍යයා: 'ඔව්! ඔව්, දැන්නම් මටත් තේරෙනවා."

රජු: (මඳක් දුර ගමන්කොට) "අපේ පැමිණීම මේ වනෙහි තවුසන්ට බාධාවක් වේ නම් ඒ නුසුදුසුයි. එහෙයින් රිය නවත්වා අපි බහිමු."

රථාචාර්‍යයා: "හොඳමයි දේවයන් වහන්ස, බසිනු මැනවි."

රජු: (රියෙන් බසිමින්) "රථාචාර්‍ය! මේ තපෝවනයට අප පිවිසිය යුත්තේ විනීත වේශයෙනි. මෙය පසෙකින් තබන්න." (දුන්නද, ඊතලද, කඩුවද රථාචාර්‍යයාට දෙයි)

රථාචාර්‍යයා: "හොඳමයි දේවයන් වහන්ස,"

රජු: "මේ තියෙන්නේ අසපුවට යන දොරටුව, මෙතනින් ඇතුල්වෙමු" (අසපුවට ඇතුල්වෙමින්) "හරිසාන්තයි නෙ මේ අසපුව."

අසපු වැසියෙක්: "මිත්‍රවරුනි, මිත්‍රවරුනි, මෙහෙන්-මෙහෙන්."

රජු: (සවන්දෙමින්) "කවුද ඒ කථාකරන්නේ?" (ඉදිරියට ගමන් කරයි. යම් කිසිවක් දැක හදිසියෙන් විෂ්මයට පත්වෙයි, සෙමින් කථා කරයි) "අර–අර–අර-තාපස කන්‍යාවෝ තමන්ගේ ප්‍රමාණයට ගැලපෙන වතුර කළ රැගෙන මල් පැළවලට වතුර වත්කරන හැටි. හරි මිහිරි දැකුමක් නෙ ඒ. අපි පොඩ්ඩක් නැවතී ඔවුන් දෙස බලා සිටිමු." (සකුන්තලා සිය යෙහෙළියන් සමඟ පැමිණෙයි.)

සකුන්තලා: "මෙහෙන් එන්න මෙහෙන් එන්න!"

අනසූයා: "ඔබටත් වඩා ඔබගේ පියා හරි ආසයි මේ මල් පැලවලට. දැසමන් කුසුමක් මෙන් කෝමළ වූ ඔබ, මේ මල් පැලවලට වතුර වත්කරමින් වෙහෙසෙන්නේ ඒ නිසා නොවැ."

සකුන්තලා: "නැහැ තාත්තගේ නියෝගයෙන් ම නොවෙ, සහෝදරයෙකුට වගේ මාත් හරි ආශයි මේ මල්වලට."

රජු: (තෙමේම කියා ගනී) "හා මේ කාන්තාව ඉර්සිවර යාගේ දුව නොවැ. මෙ ගහට මුවාවෙලා ඇය බලා ගන්න ඕනැ." (ඔහු එසේ කරයි.)

සකුන්තලා: "අනුසූයා! අනුසූයා! අනේ, මෙ නිකන් ඉන්නෙයි කියන්න මේ ප්‍රියංවදට" "අනේ බලන්න මේ ප්‍රියංවද වල්කලා පට්ටයකින් බඳින හැටි. ඉතින් ඇවිල්ල මේක ලිහන්නකෝ!"

අනසූයා: "හොඳයි! හොඳයි! මේ එනවා." (වල්කලා පට්ටය ලිහයි.)

ප්‍රියංවද: (සිනාසෙමින්) "දැන් ඉතින් පයෝදර පැතිරි යොවුන් බව ලබාවී."

රජු: "ඔව්! ඔව්, මේ වයසේ හැටියට වල්කලා පට්ට බඳින එක හොඳ නැහැ."

සකුන්තලා: "අන්න අන්න අර මුහුණුමල් ගස සුළඟින් සෙලවෙන හැටි අනේ යමු අපි එතෙන්ට"

G. WINDSOR
HEADQUARTERS SCOUT COMMISSIONER
J. E. PERERA MAWATHA,
MAGALLE - GALLE.



ප්‍රියංවද: "හොඳයි! හොඳයි! සකුන්තලා යමු. ඔබ හරියට ඒ ගහේ වැලක් වගේ නෙ."

සකුන්තලා: "ඇයි මම විතරක්, ඔබත් ඒවගේ නේ."

අනසූයා: "සකුන්තලා, සකුන්තලා, බලන්න අර වනජෝත්සනා නැමති දැසමන්වැල, ඔබ කියාපු නම දැන් ඔබටම අමතක වෙලයි තියෙන්නේ. දැන් ඒ වනජෝත්සනා වැල අර මී අඹ ගහේ ප්‍රියාව බව ඔබ දන්නෙ නැද්ද?"

සකුන්තලා: "ඇත්තමයි, මට අමතක වෙලයි තිබුනේ. ඒ ලතාවට අර ගහ වැලඳ ගැනීමට සුදුසු කාලය මෙයයි"

ප්‍රියංවද: "අනසූයා! ඔයා දන්නවාද මේ සකුන්තලා මේ වනජෝත්සනා දෙස ඕනෑ කමින් බලන කාරණය."

අනසූයා: "නෑ—නෑ—මම දන්නේ නෑ කියන්නකො."

ප්‍රියංවද: "මේ වනජෝත්සනා වැල සුදුසු කාලයෙහි සුදුසු ගසක් වැලඳගත්තා වගේ දැන් සකුන්තලාත් බලා පොරොත්තු වෙනවා ඇයට සුදුසු ස්වාමියකු වැළඳ ගන්න."

සකුන්තලා: "ඒ ඔයාගෙ හිතේ තියෙන අදහස. අනේ ඉක්මන් කරල එන්න! මේ හොර මී මැස්සෝ මගේ මූණට අනින්න හදනව, අනේ මා ආරක්ෂාකරගන්න. අපි යමු වෙනින් තැනකට."

යෙහෙළියන් දෙදෙනා: (සිනාසෙමින්) "අප ආරක්ෂා කරන්නේ කව්ද? දුෂ්‍යන්ත රජ හැර."

"මේ වනෙහි ආරක්ෂකයා දුෂ්‍යන්ත රජ තමයි."

රජු: (ඔවුන් ඉදිරියෙහි පෙනී සිටිමින්) "භයවෙන්න එපා, භයවන්න එපා, ඔබගේ ප්‍රාර්ථනය එසේම වේවා! මම යි ඒ රජු"

අනසූයා: "රජතුමනි, මේ අපේ යෙහෙළිය මී මැස්සන්ට බය වෙලා."

රජු: (සකුන්තලාට අභිමුඛව) "ඕ! තපස් රකිනවද?"

අනසූයා: "සකුන්තලා! සකුන්තලා! මේ ආගන්තුක සත් කාරයට නුසුදුසු වෙලාවයි. ඔයා යන්න පන්සලට. ගිහිල්ලා පල වැල පිළියෙළ කරන්න. මෙන්න පා සෝද ගැනීමට වතුර."

රජු: "ඔබ තුමියන්ගේ වචන ඇසීම මට කළ ආගන්තුක සත්කාරයක් වැනිය."

ප්‍රියංවද: "එහෙනම් රජතුමනි, අර සීතල සෙවන ඇති සප්තපර්ණී වේදිකාවට ගොස් මොහොතක් විඩා හරින්න"

රජු: "දැන් විඩා ඇත්තේ මට නොවෙයි. වතුර වැක්කිරී මෙහි යෙදුනු ඔබ තුමියන්ටයි."

අනසූයා: "සකුන්තලා, ආගන්තුක සත්කාරයට මේ සුදුසුම අවස්ථාවයි. අපි එතනට යමු."

රජු: "සම වයසින් සමාන රූප සෞන්දර්යයෙන් රමණීය වූ මොවුන්ගේ ගතිගුණ අතිශයින්ම පුදුමයි."

ප්‍රියංවද: (රහසින්) "කොතරම් ලක්ෂණද මේ රජතුමා."

අනසූයා: "මට නම් හරිම සැක යි, මේ රජතුමා හුදකලා-වම මෙහි පැමිණි කාරණය ගැන. මෙතරම් සියුමැලි රජෙකු රජය අත්හැර මේ තපෝවනයට පැමිණීමට කොයිතරම් ලොකු කරුණු ඇතිවිය යුතුද? කොහොම වුනත් මේ වනය ධර්මචාරීහුගෙන් සාන්තයි."

යෙහෙළියන් දෙදෙනා: "හොඳයි. සකුන්තලා, අද තාත්තා ආවොත්"

සකුන්තලා: "ඉතින් මොකෝ වෙන්නෙ."

යෙහෙළියන් දෙදෙනා: "වෙන දෙයක් නැහැ. ජීවිත පූජාවෙන් වුවත් ආගන්තුක සත්කාර කරාවි."

සකුන්තලා: "ඔය කතාකරන්නේ හිතේ තියෙන දේවල්. මට නම් ඔය කතා විශ්වාස කරන්න බැහැ."

G. WINDSOR
HEADQUARTERS SCOUT COMMISSIONER
373, L. E. PERERA MAWATHA,
MAGALLE - GALLE.



රජු: "හොඳයි. අපි තව තවත් ඔය යෙහෙළියගේ හිතේ තියෙන දේවල් අහමු."

යෙහෙළියන් දෙදෙනා: "එහෙමයි රජතුමනි!"

රජු: "භගවත් කාශ්‍යප තුමා බ්‍රහ්ම භක්තිකයෙකැ යි ලෝකයෙහි ප්‍රසිද්ධ යි. ඔහුගේ මේ දුවත් එහෙම වෙන්න ඇති නේද?"

අනසූයා: "ඔන්න එහෙනම් අහන්න. ඔබතුමා අහල ඇති කෞශික ගොත්‍රයෙහි උපන් රාජ ඉසිවරයෙකු ගැන"

රජු: "ඔව්; ඔව්, අහල තියෙනවා"

අනසූයා: "එතුමාගෙන් පැවත එන කාශ්‍යප ඍෂිවරයාගේ දුව තමයි මේ. වරක් ඒ රාජ ඍෂිවරයා ගෞතම තීරයෙහි යෝග වඩමින් සිටියා. කිසියම් දෙවියෙකු විසින් ඔහුගේ තපස් බව කැඩීමට මේනකා නැමති අප්සරාවක් ඔහු වෙත එව්වා"
(සකුන්තලා යෙහෙළිය දෙසට ඇඟිල්ල දිගුකරයි.)

රජු: "ඔව් ඔව් මට තේරුණා. අපි එහෙනම් වෙනින් එකක් අහමු."

ප්‍රියංවදා: "රජතුමනි නැවත නැවත විමසීමෙන් වැඩක් නෑ. තවුසෝ නම් ප්‍රශ්න වලින් බැඳිය නොහැක්කෝ ය. මේ තවුස් ජනයා ධර්මය හැසිරෙන්නවුන් කෙරෙහි මහත් භක්තියක් දක්වයි."

සකුන්තලා: "අනසූයා මම යන්නම්,"

අනසූයා: "ඒ මොකෝ,"

සකුන්තලා: "මේ කිසිම තේරුමක් නැති කතා කියන ප්‍රියංවදා ගැන ගෞතම ආයඝ්ඝාවට පැමිණිලි කරන්න."

අනසූයා: "ඒ වුනත් ආගන්තුක සත්කාර නොකර යන එක හොඳ නැහැ නේ?"

ප්‍රියංවදා: "ඔව්, ඔව්, යන එක නම් හොඳ නැහැ."

රජු: "මේ යෙහෙළියට මල්ගස්වලට වතුර වත් කිරීමෙන් මහන්සිත් ඇති දූන්. අර බලන්න. ස්වභාවෙන්ම රතුවූ අත් වතුර කල ඉසීමෙන් හුඟක්ම රතුවෙලා තියෙන හැටි. අර බලන්න අධික ලෙස හති දැම නිසා පියයුරු සෙලවෙන හැටි. අර බලන්න කොණ්ඩෙ අවුල් වී තිබෙන හැටි. හොඳයි දූන් මහන්සි නිසා යන්ට ඉඩ දෙමු."

**වනයෙහි ඇතින් රජු අනුව ගමන් කරණ රාජ පුරුෂයෝ.**

"තාපස වරුණි! තාපස වරුණි! අපගේ රජතුමා මෙ මේ අසපුවට පැමිණ සිටියි."

(සියල්ලෝම මේ හඬට කන්දෙති.)

රජු: (තමාටම) "ෂඃ ඔය මා සොයමින් එන රාජ පුරුෂයෝ, දූන් ඉතින් ආපසු යන්නත් එපායැ."

**යෙහෙළියන් දෙදෙනා:** "රජතුමනි, අපගේ අසපුවට කරදරයක් නොවන පරිදි අපිත් පසුව එමු."

(සියල්ලෝම නැගිටිති.)

**යෙහෙළියන් දෙදෙනා:** "රජතුමනි, සුදුසු ආගන්තුක සත්කාර කරන්ට නොහැකි වීම ගැන කණගාටු වෙමු."

රජු: "හා එහෙම හිතන්න එපා."

"ඔබ තුමියගේ දැකුම මට කළ සත්කාරයකි."

(සකුන්තලා රජු දෙස හොරැ'හින් බලා නික්ම යයි)

රජු: "මේ සකුන්තලා අත් හැර මම කෙසේ නගරයට යම්ද? මගේ සිරුර නගරය කරා යතත් මගේ සිත ආපසු ගමන් කරන්නේ සකුන්තලා වෙතයි. එහෙයින් මගේ සිරුර ඉදිරියට ගමන් කරණ ධවජ යෂ්ටියක් වැනිය. මගේ සිත ඉදිරියට ගමන් කරණ ධවජ යෂ්ටියෙහි පසු භාගයෙහි ලෙලදෙන ද්වජ වස්ත්‍රයක් වැනිය."

## 2 වන අංකය.

(වීඩාවට හා කලකිරීමට පැමිණි විදූෂක පැමිණෙයි)

විදූෂක: "අනේ වෙලා තියෙන දේක හැටි. මේ මුව දඩයමේ යෙදෙන රජ්ජුරුවන්ගේ බොළඳ කම නිසා මටත් විඳින්ට වෙච්ච දුකක්. අතන මුවෙක්, මෙතන ඌරෙක්. අර ව්‍යාඝ්‍රයෙක් ය යි කියමින්, රයේ–පානේ නොකියා වෙලාව අවේලාව නොකියා අව්වෙයි – වැස්සෙයි නොකියා කැලෙන් – කැලේට ඇවිදින එකත් එතරම් පහසු වැඩක් නොවෙයි. මෙහෙම ගමන් වලදී බොන්න වතුර ටිකක් වත් ලැබෙනවයි හොඳට.

ඉතින්, බොන්න ලැබෙනවා නම් ලැබෙන්නේ ඔය කොළ රොඩු බහුල දෙළක වතුර ටිකක් තමයි. වේලාවට කෑමක්වත් ලැබෙනවයි, ලැබෙනවා නම් ලැබෙන්නේ ඔය වේලාපු පිළුනු වෙච්ච මස් ටිකක් තමයි.

අසුන්ගේ කුර ගැටුම නිසා නිදගන්නට ලැබෙන්නේ නෑ. යම්තම් මේ එළි වේගෙන එනකොට පොඩ්ඩක් නින්ද ගියා. ඒකත් දිගට නිදගන්නට ලැබුනේ නැහැ. මේ ලිහිණි වැද්දන්ගේ කෑ ගැහීමක් නිසා. කොච්චර මහන්සි වුනත් කමක් නැහැ. මේ වන පුෂ්පය–අර සකුන්තලා දැකපු එකත් ලොකු වාසනාවක් නේ.

කෝ තවමත් නැහැනේ දේවයන් වහන්සේ, නගරයට යන්න අදහස් කරලා: ඊයේ දැකපු දේවල් දේවයන් වහන්සේට අමතක වෙලා නැතුව වගෙයි. දේවයන් වහන්ස, අද නම් හරිම අමාරුයි. අත්පා සොළවන්නත් බැරි තරම් අමාරුයි. යන්තම් කතාකරන්න විතරයි දැන් මට පුළුවන්."

රජු: (සිනාසී) "ඒ මොකෝ මොනවා වෙලාද අත්පා වලට?"

විදූෂක: "මොනවටද? ඉතින් ඒවා කියන්නේ."

රජු: "මට තේරෙන්නේ නෑ මොනවද කියල."

විදූෂක: "ඔහොම තමයි දේවයන් වහන්ස, මේ මහ ගස් පවා සුළඟට නැමෙනව නොවැ."

රජු: "ඒ වගේ දෙයක් තමයි මට වෙලා තියෙන්නේ."

විදූෂක: "දේවයන් වහන්ස, දැන් මේ ඔබ වහන්සේ රාජ්‍යයත් අත්හැරලා ඇවිදින්නේ මිනිසුන්ගේ සංචාරණයට නුසුදුසු කැලයක. මේ කැලේ ඇවිදල ඇවිදල මටත් දැන් හරි මහන්සි යි."

රජු: (සෙමින් කියයි) "මට වෙලා තියෙන එකේ අනිත් එකනේ මේ විදූෂකට වෙලා තියෙන්නේ."

විදූෂක: "මොනවද? දේවයන් වහන්සේ නො ඇසෙන සේ කොඳුරන්නේ."

රජු: (සිනා සෙමින්) "නැහැ, නැහැ, මම මේ කල්පනා කරන්නේ වෙන දෙයක් නොවේ; ඔබ වැනි සත් පුරුෂයෙකුගේ වචනයක් ඉවත ලීම නුසුදුසුය කියා."

විදූෂක: "එහෙමයි දේවයන් වහන්ස!"

රජු: 'ඔබට කියන්න කාරණයක් තිබෙනව. ඔහොම ටිකක් ඉන්න."

විදූෂක: "හොඳමයි දේවයන් වහන්ස, එහෙනම් මට කියන්න."

රජු: "ඔබ විවේක ගත්තත් ඔබෙ සේවය මට නිතරම අවශ්‍ය වෙනවා."

විදූෂක: "ඔව් දේවයන් වහන්ස, ඒකත් මොන කජ්ජක්ද? අන්න දේවයන් වහන්ස! දෙරටු පාලයෙකුත් ඇවිත් ඉන්නව'"

රජු: "ඔහු මෙහාට කැඳවන්න."
(දෙරටු පාලයා පැමිණෙයි.)

දෙරටු පාලයා: "දේවයන් වහන්ස, ඔබ වහන්සේ ගෙන් අවසර ලැබෙන්නේ මොනවාද?"

රජු: "සේනාධිපතියාත් කැඳවාගෙන මෙහාට එව."

දෙරටුපාලයා: "හොඳමයි, හොඳමයි,"
(සේනාධිපති පැමිණෙයි)

සේනාපති: "ජයශ්‍රී! මහ රජාණෙනි! දූන් ඔබ වහන්සේ මේ වනෙහි ඇවිදලා අවසාන නම් ඊළඟට අවසර ලැබෙන්නේ කොහි යන්නද?"

රජු: "සෙනෙවිය, මේ විදූෂක මගේ ධෛර්‍ය්‍ය නැති කලා නොවැ."

සේනාපති: "දේවයන් වහන්ස ධෛර්‍ය්‍ය ඇති කරගනු මැනවි."

විදූෂක: "මොනවද මේ සෙනෙවිතුමා පොඩි ළමයෙකු වගේ කතා කරන්නේ."

සේනාපති: "දේවයන් වහන්සේට කැමැත්තක් අවසර ලැබෙනු මැනවි."

රජු: "එහෙනම් මගේ සෙනඟට මේ වනය ආක්‍රමණය නො කරණ ලෙසට අණ කරන්න."

සේනාපති: "හොඳමයි දේවයන් වහන්ස"

(සේනාපති නික්මයයි.)

රජු: (සේවක ජනයා දෙස බලමින්) "ඔය දඩයමට ඇඳ ගත් ඇඳුම් දූන් ඉවත් කළ යුතුයි."

සේවක ජනයා, "හොඳමයි දේවයන් වහන්ස!"

විදූෂක: "දේවයන් වහන්ස, අර පෙනෙන දර්ශනීය සවභාවයක් ඇති, සීතල සෙවනක් ඇති ලතා මණ්ඩපයට සම්ප්‍රාප්ත වනු මැනවි."

(විදූෂක පෙරටු කර ගත් රජු ලතා මණ්ඩපයට යයි.)

විදූෂක: "එන්න රජතුමනි මෙහෙන්,"

**රජු:** "හොඳයි හොඳයි යමු." විදූෂක ඔබට බැරි උනා නෙව ඇසින් ගතයුතු පලය ලබා ගන්න. මා හිතන හැටියට දැකුම් කටයුතු දෙයක් ඔබ දැක්කේ නැහැ."

**විදූෂක:** "ඇයි ඔබ වහන්සේ? ඔබ වහන්සේ තරම් දැකුම් කටයුතු දෙයක් මේ ලෝකේ තවත් තියෙනවෑ."

**රජු:** "ඒක නොවෙයි මම කිව්වෙ. මා කතා කළේ මේ අසපුවට ආභරණයක් වූ සකුන්තලා ගැනයි"

**විදූෂක:** "අනේ, කවුද දන්නේ?"

**රජු:** "ඇයි එහෙම කියන්නේ. දෙවහනකගෙන් උපන් ඇය–දැසමන් කුසුමක් වගෙයි."

**විදූෂක:** (සිනාසෙයි) "දේවයන් වහන්සේගෙත් කතා ඕනෑකමේ හැටියට තමා හොඳ කම."

**රජු:** වැඩියෙ කතා වුවමනා නැහැ. ඇයගේ සුන්දරත්වය දුටුවොත් ඔබත් වසඟ වේ."

**විදූෂක:** "විය හැකි දේවයන් වහන්ස. ඒ නිසා ඇය ඔබ වහන්සේ විසින් රැකිය යුතුයි."

**රජු:** "ඔව් එහෙම තමයි, ඒ උනාට නිදහසක් නැහැ නොවැ. මව් පියන්ගේ කැමැත්ත මොකක්ද දන්නේ නැහැ."

**විදූෂක:** "එහෙනම් රජ තුමනි මාංගෝපකරණ ගනු මැනවි. මේ තපෝවනය බැලීමට අපි යමු."

(දෙරටු පාලයෙක් පිවිසෙයි)

**දෙරටු පාලයා:** ජයශ්‍රී මහරජාණෙනි, ඍෂි කුමාරයන් දෙදෙනෙක් අර දෙරටුවෙහි නැවති මෙතනට පැමිණීමට අවසර ඉල්ලති."

**රජු:** "එහෙනම් ඔවුන් වහා කැඳවන්න."

**දෙරටු පාලයා:** එන්න එන්න කුමාරවරුනි. මෙහෙන් එන්න මෙහෙන් එන්න."

**ප්‍රථම කුමාරයා:** මේ රජුගෙ ශරීර කාන්තිය කොතරම් ප්‍රියංකරද?''

**දෙවැනි කුමාරයා:** ''ඔව් ගෞතම, ඔහු හරියට අනංගයා වගෙයි.''

**කුමාරවරු දෙදෙනා:** (රජු වෙත එළඹ) ''ජයශ්‍රී මහ රජාණනි.''

**රජු:** (ආසනයෙන් නැගිට) ඔබ තුමන් ගෞරවයෙන් පිළිගනිමි.

**ඍෂි කුමාරවරුන් දෙදෙනා:** ''සුවපත්වේවා රජතුමනි.''

**රජු:** ''දැන් ඔබවහන්සේලා මෙහි සම්ප්‍රාප්ත වූන කාරණය දැනගැනීමට මම කැමතියි.''

**ඍෂි කුමාරවරු දෙදෙනා:** ''මේ අසපු වැසියෝ ඔබගේ පැමිණීම ප්‍රාර්ථනා කරති.''

**රජු:** ඉතින් ඔබ වහන්සේලා මට කියන්නේ කුමක්ද?''

**ඍෂි කුමාරවරු දෙදෙනා:** ''ඔබ තුමන් එහි පැමිණ රාත්‍රි කීපයක් ගතකලොත් මේ අසපුව සනාථ වන බව පමණයි අපට කියන්ට තිබෙන්නේ.''

**රජු:** ඔබ තුමන්ගෙන් මට අසන්ට ලැබුනු වචන මගේ ධෛර්‍යයට හේතු වෙනවා.''

**විදූෂක:** ''ඇත්ත තමයි. තමුන්නාන්සේලා, දේවයන් වහන්සේ බලාපොරොත්තු වූ දෙයක්මයි කීවේ.''

**රජු:** (සිනාසී) එහෙනම් දෙරටු පාලය රථාචාර්‍යයාට දන්වන්න.''

**දෙරටු පාලයා:** ''හොඳමයි දේවයන් වහන්ස.''

**රජු:** ''කුමාරවරුනි පෙරටුව ගමන් කරනු මැනවි. මම පසුව එන්නම්.''

**ඍෂි කුමාරවරු දෙදෙනා:** 'ජය වේවා රජ තුමනි.'' (දෙරටු පාලයා පිටිසෙයි)

**දෙරටු පාලයා:** රථය නම් සරසලා අවසානයි. දේවයන් වහන්ස, ඒ වුනාට දේවියගෙන් පණිවිඩයකුත් ඇර ගෙන 'කරභක' ඇවිදින් ඉන්නවා.''

**රජු:** ''මොනවා? මැණියන්ගෙන් පණිවිඩයක්.!''

**දෙරටු පාලයා:** ''ඔව්, ඔව්.''

**රජු:** ''ඇයි කරභකට මෙහාට එන්න කිව්වෙ නැද්ද?''
(දෙරටු පාලයා සමග කරභක පැමිණෙයි)

**කරභක:** ''ජයශ්‍රී මහ රජාණනි, මෙන්න දේවියගෙන් පණිවිඩයක්.''

(රජු සන්දේශය ගෙන කියවයි)

''ප්‍රිය පුත්‍රයාණනි!
ලබන හතරවෙනිද මගේ උපවාස දවසයි. එදිනට ඔබගේ පැමිණීම බලාපොරොත්තු වෙමි.

මෙයට,
ආදරණීය,
මව.

**රජු:** ''ඉතින් බලන්න විදූෂක ඔක්කොම වැඩ අවුල් වුනා. මැණියන්ගේ කැඳවීමත්, තවුසන්ගේ කැඳවීමත් වැළක් විය නොහැකියි මේ කාරණය විසදීමට ඔබට පුළුවන්.

**විදූෂක:** ''ඇයි දේවයන් වහන්ස, මම කොහොම ඒ ඉටු කරන්නද? ඔබ වහන්සේ නොවෙයි මම.''

**රජු:** ''එහෙම නොවෙයි විදූෂක. මේ සත්‍ය කාරණය අන්තඃ පුරයට ගිහිල්ලා කියන්න. මම ආශ්‍රමයට යන්නෙ ඉසි වරුන් කෙරෙහි ගෞරවයෙන්. තාපස කන්‍යාවන් කෙරෙහි ආලයෙන් නොවෙයි.''

(සියල්ලෝම නික්ම යති.)

# 3 වන අංකය

(කුස තණ රැගත් ශිෂ්‍යයා පිවිසෙයි.)

ශිෂ්‍යයා: "පුදුම ආනුභාවයක් නොවැ මේ දුෂ්‍යන්ත රජුට තියෙන්නේ. එතුමා මේ වනයට පිවිසි හැටියෙම මේ වනය කොතරම් ආරක්ෂා සහිත වුනාද? කාටද ප්‍රියංවද ඔය ඇඟ ගල්වන ආලේපත් නෙළුම් කොළත්-නෙළුම් දඬුත් අරගෙන යන්නේ."

ප්‍රියංවද: "ඇයි දන්නේ නැද්ද? මේවා ගෙන යන්නේ සකුන්තලාට නේ."

ශිෂ්‍යයා: "හොඳමයි, හොඳමයි ඉක්මනට යන්න."
(රිය සක් හඬ ඇසෙයි.)

රජු: "මේ නදී තීරය කොතරම් ලක්ෂණද? මේ නදියෙ නම මොකක්ද?"

රථාචාර්යයා: "මේ නදියට තමයි මාලිනී කියන්නේ. බලන්න රජ තුමනි, අර වේවැල් පඳුර ළඟ තිබෙන ලතා මණ්ඩපය කොතරම් ලක්ෂණද කියා."

රජු: "(විෂ්මයෙන්) "ඔහෝ – අර – අර පේන්නේ මල් වලින් වැසුනු ගල්තලාවක්. අර එහි සයනය කරන්නේ සකුන්තලා තමයි."

(රියෙන් බට රජු වේවැල් පඳුරට මුවා වී සිටියි.)

යෙහෙළිය: "සකුන්තලා, ඔයාට මේ නෙළුම් පත් සැපයි නේද?

සකුන්තලා: "ඔව් දන් පවන් සැලීමෙන් නම වැඩක් නැහැ."

ප්‍රියංවද: (හෙමින්) 'බලන්න අනසූයා අර රජතුමා දැකපු දවසේ ඉඳලා මේ සකුන්තලාට වෙලා තියෙන දේ."

අනසූයා: ''යෙහෙළිය, මට විශාල සැකයක් ඇතිවෙලා තියෙනවා ඔබ ගැන. ඔබේ මේ පශ්චාත්තාපය සුළු එකක් නොවෙ. අනේ කියන්නකෝ ඒකට හේතුව මොකක්ද කියලා.''

සකුන්තලා: ''මොනවද ඔයා මට කියන්නෙයි කියන්නේ.''

අනසූයා: ''ඔයාගෙන් මට දැනගන්න ඕනෑ. ඔයාගේ මේ පශ්චාත්තාපයට හේතුව. මෙයට පිළියමක් කරන්න වුනත් එයට හේතුව ඉස්සෙල්ලා දැනගන්නට ඕනෑ බව ඔයා දන්නේ නැද්ද?''

රජු: (සෙමින් තමාටම කියා ගනිමින්) ''අන්න අනුසූයාගේ තර්කය හරියටම හරි.''

සකුන්තලා: ''මගේ හිතේ තියෙන ලොකුම වේදනාවක් ඔය තරම් ඉක්මනට ඒක කියන්න අමාරුයි.''

ප්‍රියංවද: ''ඔය කාරණය කියන්න දැන් ඉතින් ප්‍රමාද කරණ එක එතරම් හොඳ නෑ. බලන්න ඔයා දැන් කොපමණ වෙනස් වෙලාද කියල.''

සකුන්තලා: ''ප්‍රියංවද ඔයාට මතකයි නේ එද අර මල් ගස්වලට වතුර වක්කරද්දී හමු වුන රජ තුමා. එද පටන් තමයි මගේ මේ වේදනාව.

අනසූයා: ''දැන් ඉතින් මේ සකුන්තලාගේ මනදෙළ පුරණ උපාය මොකක් ද?''

ප්‍රියංවද: ''ඒක එතරම් දෙයක් නොවෙයි.''

අනසූයා: ''හොඳයි ඒ මොකක්ද?''

ප්‍රියංවද: ''මට හිතෙන හැටියට රජුටත් වෙලා තියෙන්නේ සකුන්තලාට වෙච්ච දේමයි''

අනසූයා: ''හොඳ උපායක් නම් කල්පනා වුනා, සකුන්තලා ඒක කියාවිද දන්නේ නැහැ?

සකුන්තලා: ''උපායක් නම් ඒකට මොනවද කියන්නෙ.''

ප්‍රියංවද: "හොඳා ඔයා හිතන්න තේරවිල්ලක් – නැත්නම් කතාන්තරයක්."

සකුන්තලා: "හොඳයි මං හිතන්නම් අනේ ඒ වුනාට හිත නම් එකහ වෙන්නේ නැහැ. හොඳයි ඔන්න ඒ වුනත් ගියක් මට මතක් වුනා. හැබැයි ඒක ලියා ගන්න ක්‍රමයක් නැහැ."

ප්‍රියංවද: "ඔයාගේ නිය පොත්තකින් ඒක ඔය නෙළුම් කොළ කැල්ලක ලියන්නකෝ."

සකුන්තලා: "ඔන්න එහෙනම් ලිව්වා."

යෙහෙළිය: "ඉතින් කියවන්න කෝ ඒක."

(සකුන්තලා ගීතය කියවයි)

ගීතයේ සිංහල අනුවාදය:

"ඔබගේ හදවත ගලක් දැයි මම නොදනිමි"

අනංගයා රෑ දහවල් දෙක්හි මා දවයි"

යෙහෙළියෝ: (සිනාසෙමින්) "ඒ උපක්‍රමයෙහි ප්‍රතිඵල වලට වැඩි වේලාවක් ගියෙ නැහැ නේ."

(රජු ඉදිරියට එයි)

රජු: "සකුන්තලා, සකුන්තලා, නැගිටින්න එපා. ඔබට දැන් මහන්සිත් ඇති."

අනසූයා: "නැහැ, ඔබ වහන්සේ ගල්තලාවෙහි ඉඩ තියෙන තැනකින් වාඩි වෙන්න."

ප්‍රියංවද: "බලන්න අනසූයා, මේ දෙදෙනාට අන්‍යොන්‍ය ප්‍රේමය දැනුන හැටි"

රජු: ඔව්, ඔව්, ඒක එතරම් පුදුමයක් නොවෙයි."

ප්‍රියංවද: "දැන් ඉතින් ඔබ වහන්සේගේ යුතුකම තමයි ඇගේ පීඩාව සංසිඳුවීම"

රජු: ''පීඩාව අපෙන් විතරක් සිදුනොවන නිසා එය සංසිඳ–වීම අපෙන් විතරක් බලාපොරොත්තුවෙන එක අමාරුයි.''

ප්‍රියංවද: ''එහෙනම් සකුන්තලා ඔබ නිසා මේ දුඃඛිත අවස්ථාවට පත් කරලා තිබෙන්නේ අනංගයාද?''

රජු: සකුන්තලාගේ මේ තත්වය සැබැවින්ම සාධාරණයි. එහෙත් ඇය රැක ගැනීම මට බාරයි.''

සකුන්තලා: ''හැබෑද යෙහෙළිය මේ කියන්නේ.''

ප්‍රියංවද: ''ඇයි සකුන්තලා ඔබට සෑම දෙයක්ම සැක. ඒ ගැන අවිශ්වාස කරන්න දෙයක් නැහැ.''

රජු: ''අන්න ප්‍රියංවදට තමයි කාරණය තේරිලා තියෙන්නේ.

ප්‍රියංවද: (තැතිගත් මුව පොව්වෙකු අසල සිටියි) ''අනසූයා අනසූයා, අර බලන්න මුවැත්තියකගෙන් වෙන් වුනු මුව පෝතකයෙක්. ඔය ඔය බලන්නේ මුවැත්තිය ගිය දිහාවයි. යමු, යමු, උං අල්ල ගන්න.''

සකුන්තලා: 'අනේ! ඔය ගොල්ල ඔක්කෝම යනවද? මා තනිකර දාල කවුරු හරි නවතින්න කෝ!''

අනසූයා: මේක නේ වැඩේ, පොළොව ආරක්ෂා කරණ රජ කෙනෙකුත් සිටිය දී ඔබට ඇති තනිය මොකක්ද?

සකුන්තලා: ''හොඳයි, හොඳයි, යන්නකෝ.''

(රජු සකුන්තලා වෙත ළංවෙයි)

රජු: (සෙමින්) ''කලබල වෙන්න එපා, කලබල වෙන්න එපා මේ අසපුව විසින්ම කැඳවනු ලැබූ මම යි මේ ඔබ ළඟ ඉන්නේ.''

සකුන්තලා: 'ඔබ වැනි ගරු කටයුතු උත්තමයන් මගේ ආරක්ෂාවට යොදා ගැනීමට මම කැමති නෑ. මට දූන් යන්ට ඕනෑ අසපුවට.''

රජු: 'සුන්දරි' අසපුවට යාමට මොකද ඔය තරම් ඉක්මන්?''

සකුන්තලා: ''රජ තුමනි ආරක්ෂාවත් එක්තරා හික්මීමක්, කාමයෙන් ආතුරවූවෝ ආරක්ෂාවට ද හික්මීමට ද, නොකැමති වෙති.''

රජු: ''නැහැ නැහැ මෙහි සිටීම ගැන ඔබේ පියා මොකුත් කියන එකක් නැහැ.''

සකුන්තලා: ''අනේ බැහැ බැහැ. මට යන්න ඉඩ අරින්න. අර යෙහෙළියන් එක්ක මාත් යන්න ඕනෑ.''

රජු: ''හොඳයි, හොඳයි''

සකුන්තලා: 'හොඳයි, ඔබ මට කොයි වෙලාවෙද යන්න දෙන්නේ?''

රජු: ''සුන්දරිය! හාපුරා කියා සුපිපුන කුසුමක් වෙත පැමුණුන මී මැස්සා ඒ කුසුම අත්හරින්නේ මල් පැනි පානයෙන් පසුවය. මම මී මැස්සෙක් නම් ඔබ මගේ පුෂ්පය යි. මී මැස්සෙකු රොන් අරගෙන පුෂ්පය මුදන්නාක් මෙන් ඔබගේ මුව පියුම පානය කිරීමෙන් පසුවයි මා ඔබට යන්න දෙන්නෙ.''

(වන විල්වල සක්වාවෝ නද දෙති. ක්‍රමයෙන් සන්ධ්‍යාව ලං වූවාය.)

සකුන්තලා: (ඉක්මන්ව) 'රජ තුමනි, මගේ ආරක්ෂක මාතාව වන ගෞතමී තවුස් තුමී මෙහි පැමිණෙනවා. ඔබ අර පඳුරට මුවාවෙන්න.''

රජු: (හෙමින්) ''හොඳයි, හොඳයි'' (උණ පඳුරකට මුවාවෙයි) (යෙහෙළියන් දෙදෙනාද පාත්‍රයක් අතින් ගත් ගෞතමියද පැමිණෙයි.)

යෙහෙළියන් දෙදෙනා: ''ආයර්‍යාව මෙහෙන් එන්න, මෙහෙන් එන්න.''

**ගෞතමී:** (සකුන්තලා වෙත පැමිණ) ''දුවේ දැන් කොහොමද? ඔබට සුවදයකද?''

**සකුන්තලා:** ''ඔව මාතාවෙනි, දැන් සනීපයි.''

**ගෞතමී:** ''දුවේ! එහෙනම් මේ ඊතණ වතුර ටික බොන්න. තවත් සනීප වේවි. දැන් රෑත් වේගෙන එනව. දැන් අපි යමු අසපුවට.''

# 4 වන අංකය.

අනසූයා: "ප්‍රියංවද ඔයා හිතල නැද්ද මේ සකුන්තලාත් දුෂ්‍යන්තත් අතර ගාන්ධර්ව විවාහයක් වුනොත් හොඳය කියල. ඒ විධියේ ප්‍රෙම විවාහයක් සිදුවුනොත් තමයි මගේ හිතටත් ඉස්පාසුවක් ලැබෙන්නේ."

ප්‍රියංවද: "කොහොමද ඉතින් එහෙම එකක් වෙන්නේ."

අනසූයා: "අර දුෂ්‍යන්ත රජු දැන් නගරයට ගිහිල්ලා සකුන් තලා ගැන තවමත් කල්පනා කර කර ඇති."

ප්‍රියංවද: "ඒක මොන පුදුමයක්ද? ආපසු ආවොත් තමා පුදුමෙ."

අනසූයා: "මමත් ප්‍රාර්ථනා කරන්නේ ඒහෙම තමයි."

ප්‍රියංවද: "ඒ වුනාට එහෙම වේවිද?"

අනසූයා: "දෛවය තමයි ඒ ඔක්කෝටම."

ප්‍රියංවද: "අනසූයා මොනවටද මේ මල් දෙවියන්ට පුදන් වද?"

අනසූයා: "නෑ නෑ සකුන්තලාගේ සෞභාග්‍ය නැමති දේවතා වියට පිදීමට."

ප්‍රියංවද: "හොඳයි හොඳයි" (කන්යොමු කරමින්) "අමුත්තෙකු ආව වගෙ ඇහෙනවා. අසපුවෙ සකුන්තලා ඉන්නවා නොවැ"

අනසූයා: "ඉන්නවනම් තමයි ඒ වුනාට මේ මල් වලින් නම් වැඩක් නෑ."

ප්‍රියංවද: "බලන්න අනසූයා, මේ සකුන්තලාට වෙච්චදේ. සිහිවෙන කොට මේ ජීවිතය මොනවටද කියල හිතෙනවා. එකත් එකට මට හිතෙන්නේ මේක කිසියම් ඍෂි වරයෙකුගේ ශාපයක්ය කියලයි. මේ දූර්වාස ඍෂිවරයා මහානුභාව සම්පන්න නිතර කෝපවන කෙනෙක් එතුමාගේ ශාපයක්ද දන්නෙත් නැහැ."

අනඝූයා: ''එහෙනම් ප්‍රියංවද ඉක්මනට ගිහිල්ලා, ඒ සෘෂිවරයාගේ පය පාමුල වැඳ වැටිලා, එහෙම ශාපයක් තියෙනවා නම් අත් හරවන්න.''

ප්‍රියංවද: ''හොඳයි, හොඳයි.''

අනඝූයා: ''ෂඃ ඉක්මන් කම නිසා මෙන්න මල් ගොටුවත් වැටුනා''

(ප්‍රියංවද ගොස් ආපසු එයි)

ප්‍රියංවද: 'කිසි වැඩක් නැහැ, නිකන් මහන්සි වුනා විතරයි',

අනඝූයා: ''ඒ මොකෝ''

ප්‍රියංවද: ''සෘෂිවරයා කරපු ශාපය නවත්වන්නට ඔහු කැමති නැහැ. මම කිව්වා ඉතාම ගෞරවයෙන් ඔබ වහන්සේගේ අසරණ දියණියගෙන් නොදැන යම් වරදක් වුනා නම් ඒකට සමාවෙන්න කියල.''

අනඝූයා: (විස්මයාකුලව) ''ඉතින්, ඉතින්''

ප්‍රියංවද: ''ඉතින් ඔහු මොනවදෙ කොඳුර කොඳුරා මට නොපෙනී ගියා.''

අනඝූයා: ''ඒ වුනාට පොඩ්ඩක් ඉවසන්ට පුළුවන් කාරණයක් තියෙනවා. එද දුෂ්‍යන්ත රජු විසින් ඔහුගේම නම කෙටූ මුද්ද ඔහු විසින් සකුන්තලාට දීලා තියෙනව. ඒ මුද්ද ඇගේ අනාගතය තීරණය කරාවි''

ප්‍රියංවද: ''යෙහෙළිය මේ දේව කෝපය අප ඇයට දන්වමු.''

(යෙහෙළියෝ සකුන්තලා වෙත යති)

ප්‍රියංවද: (සෙමින්) ''බලන්න වම් අත්ල නික-තල්ලේ (නිකටේ) තබාගෙන කිරිගරුඩ රූපයක් වගේ සකුන් තලා ඉන්න හැටි''

අනඝූයා: ''යෙහෙළිය මේ ප්‍රවෘත්තිය දන්නේ අපි දෙන්නා විතරයි වෙන කාටවත් කියන්න එපා. මේ සකුන්තලා අපි කොහොම හරි රැක ගනිමු''

අනසූයා: "එහෙනම් ප්‍රියංවද ඉක්මනට ගිහිල්ලා, ඒ සෘෂි-වරයාගේ පය පාමුල වැඳ වැටිලා, එහෙම ශාපයක් තියෙනවා නම් අත් හරවන්න."

ප්‍රියංවද: "හොඳයි, හොඳයි."

අනසූයා: "ෂඃ ඉක්මන් කම නිසා මෙන්න මල් ගොටුවත් වැටුනා"

(ප්‍රියංවද ගොස් ආපසු එයි)

ප්‍රියංවද: 'කිසි වැඩක් නැහැ, නිකන් මහන්සි වුනා විතරයි,'

අනසූයා: "ඒ මොකෝ"

ප්‍රියංවද: "සෘෂිවරයා කරපු ශාපය නවත්වන්නට ඔහු කැමති නැහැ. මම කිව්වා ඉතාම ගෞරවයෙන් ඔබ වහන්-සේගේ අසරණ දියණියගෙන් නොදන යම් වරදක් වුනා නම් ඒකට සමාවෙන්න කියල."

අනසූයා: (විස්මයාකුලව) "ඉතින්, ඉතින්"

ප්‍රියංවද: "ඉතින් ඔහු මොනවදෙ කොඳුර කොඳුරා මට නොපෙනී ගියා."

අනසූයා: "ඒ වුනාට පොඩ්ඩක් ඉවසන්ට පුළුවන් කාරණ යක් තියෙනවා. එද දුෂ්‍යන්ත රජු විසින් ඔහුගේම නම කෙටූ මුද්ද ඔහු විසින් සකුන්තලාට දීලා තියෙනව. ඒ මුද්ද ඇගේ අනාගතය තීරණය කරාවි"

ප්‍රියංවද: "යෙහෙළිය මේ දේව කෝපය අප ඇයට දන්වමු."

(යෙහෙළියෝ සකුන්තලා වෙත යති)

ප්‍රියංවද: (සෙමින්) "බලන්න වම් අත්ල නික–තල්ලේ (නිකටේ) තබාගෙන කිරිගරුඬ රූපයක් වගේ සකුන් තලා ඉන්න හැටි"

අනසූයා: "යෙහෙළිය මේ ප්‍රවෘත්තිය දන්නේ අපි දෙන්නා විතරයි වෙන කාටවත් කියන්න එපා. මේ සකුන්තලා අපි කොහොම හරි රැක ගනිමු"

G. WINDSOR
HEADQUARTERS SCOUT COMMISSIONER
... PERERA MAWATHA.
MAGALLE - GALLE.


(උදෑසනකි. කුකුළන් හා කාකයන් හඬලද්දී නිදිගැට හැර නැගී සිටි ශිෂ්‍යයෙක් ගුරු දේවයන්ගේ අවසර පරිදි කාන්තා අසපුවට පිවිසෙයි.)

ශිෂ්‍යයෙක්: ''ආර්යාවරුනි, ආර්යාවරුනි, දැන් එළිවෙලා නැගිටින්න. නැගිටින්න. අන්න ගුරුදේවයන්ගෙන් අවසර ලැබෙනවා හෝම පූජාවට සූදනම් වෙන්න කියල.''

අනසූයා: ''අවදිවෙලා තමයි-ඉන්නේ, ඒ වුනාට මොකෝ අනපය දිගු කරන්නේ නැහැ නොවැ. මේ ඔක්කොම විකාර. අර දුර්වාස ඍෂිවරයාගේ ශාපයම තමයි. දැන් ඉතින් මේ තත්වය වැලැක්වීමට තියෙන්නේ අර මුද්ද පිටත් කරණ එකයි. දැන් ගුරු දේව කාශ්‍යප තුමාට සකුන්තලාගේ තත්වය දක්වන එක හොඳයි.''

ප්‍රියංවද: (සිනාසී) ''එහෙනම් ඉක්මනට සකුන්තලාගේ ගමනට කටයුතු පිළියෙළ කරන්න. මම ගිහිල්ල එන්නම් ගුරු දේවයන් ළඟට''

(ප්‍රියංවද ගොස් පමා නොවී එයි)

අනසූයා: ''කොහොමද? ගමනේ තොරතුරු?''

ප්‍රියංවද: මම දැන් ගියා සකුන්තලාගේ සුවදුක් අහන්න. එතකොට මම දැක්කා කාශ්‍යප ඍෂිතුමා ලජ්ජාවෙන් බිම බලාගෙන සිටින සකුන්තලා සනසනවා.''

අනසූයා: ''කවිද! ඔය ප්‍රවෘත්තිය කාශ්‍යප ගුරුදේවයන්ට කිව්වෙ''

ප්‍රියංවද: ''එතුමාට කවුරුත් කියන්න ඕනෑ නැහැ''.

අනසූයා: ''එහෙම නම් මට අර මී අඹ අත්තේ එල්ලිලා තිබෙන පොල් කටුවෙහි ඇති වකුල මාලාව ගෙනත් දෙන්න. එතකම් මම ගෝරෝචන මිශ්‍ර පුණ්‍ය තිර්ථයෙහි මැටි වලින් තිලකයක් තබා ගන්නම්.''

ප්‍රියංවද: ''අනසූයා, අනසූයා, ඉක්මන් කරන්න අර එන තාපසවරුනුත් හස්තිනාග පුරයට යනව වගෙයි.''

**අනසූයා:** 'හොඳමයි, හොඳමයි, එන්නකෝ ඔය මාලයත් ඇරගෙන.''

**ප්‍රියංවදා:** ''මේ සුන්දර උදෑසනක්. බලන්න අර තවුසියන් උදෑසනම ස්නානය කොට හැල් කරල් අතින් රැගෙන සකුන්තලා වෙත යන හැටි. අපිත් යමු එහෙ.''

(යෙහෙළියන් දෙදෙනා සකුන්තලා වෙත යති)

**පළමුවෙනි තවුසිය:** ''දුවේ, සවාමියාට ගරු කිරීමට නම් ඔහුගේ මවටද ගරු කරන්න!''

**දෙවෙනි තවුසිය:** ''දුවේ, ඔබ වීර පුත්‍රයෙකු ඇති කරන්-නියක් වේවා!''

**තුන්වෙනි තවුසිය:** ''දුවේ, ඔබ සවාමියාගේ ආදරය දිනා ගන්නියක් වේවා!''

(තවුසියෝ නික්ම යති, යෙහෙළියන් දෙදෙනා සකුන්-තලා වෙතම පැමිණෙති)

**යෙහෙළියන් දෙදෙනා:** ''සකුන්තලා ඔබට සුබ උදෑසනක් වේවා!''

**සකුන්තලා:** ''ඔබතුමියන් දෙදෙනාටත් සුබ උදෑසනක් වේවා! මෙහි ඉඳ ගන්න.''

**යෙහෙළියන් දෙදෙනා:** ''එහෙනම් සොහොයුරිය සූදනම් වෙන්න. අපි තිලකය තියන්නම්.''

**සකුන්තලා:** ''හොඳයි, හොඳයි, මාත් මේ ඒකට තමයි සූදනම් වුනේ.''

**යෙහෙළියන් දෙදෙනා:** ''අනේ-බලන්න! ඔයා මේ අඩල තියෙන හැටි. මේ මඞ්ගල සමයෙහි අඬන එක මොන මෝඩ කමක්ද?''

**ප්‍රියංවදා:** ''මේ ආශ්‍රමයෙහි සුලභව තිබෙන පුෂ්පයන් සකුන්තලා සැරසීමට ලැබෙනවා නම් කොච්චර නම් හොඳද ?''

(ආභරණ ගත් අත් ඇතිව සෘෂි කුමාරවරු දෙදෙනෙක් පැමිණෙති.)

**සෘෂිකුමාරවරු:** 'මෙන්න, මෙන්න ආභරණ දැන් ඉතින් සරසන්න''

(සියල්ලෝම විෂ්මිත වෙති)

**ගෞතමී:** ''පුත්‍ර නාරද කොයින්ද ඔය?''

**ප්‍රථම සෘෂිකුමාරයා:** ''ඇයි දන්නේ නැද්ද මේවා කාශ්‍යප සෘෂිවරයාගේ ආනුභාවය තමයි''

**ගෞතමී:** ''හිතේ බලේ හැටි ඔහොම තමයි.''

**ද්විතීය සෘෂිකුමාරයා:** ''නැහැ නැහැ, ඒ නිසා නොවෙයි. අපට ඇහුනා මෙහි කව්දෝ කියනවා සකුන්තලා සැරසීමට ආභරණ ගේන්නෙයි කියල''

**ප්‍රියංවද:** ''නැගණිය, මොවුන් මේ එළවූ අබරණ ඔබ අනාගතයෙහි ලබන රජසිරි සිහියට නංවයි.''

(සෘෂි කුමාරයෝ දෙදෙනා නික්මයති)

**සෙහෙළියෝ:** ''දැන් මේ ආභරණ පැළඳ ගනිමු.''

(ජලස්නානයෙන් පසු කාශ්‍යප සෘෂිවරයා පැමිණෙයි)

**දියණිය:** ''කාශ්‍යප තුමා දැන් මෙහි පැමිණෙනවා. ආචාර කිරීමට සැරසෙන්න.''

**සකුන්තලා:** ''පියාණනි මෙන්න මගේ නමස්කාරය.''

**කාශ්‍යප:** ''ඔබට සැපවේවා! කෝ සාර්ඩගරව, කොහෙද?''

**සාර්ඩගරව:** මෙහි ඉන්නව ගුරුදේවයාණනි.''

**කාශ්‍යප:** ඔබ මේ සොහොයුරියට මග පෙන්වන්න ඕනැ.''

**සාරඩගරව:** හොඳමයි, ගුරු දෙවියන් වහන්ස,''

(සියල්ලෝම නික්ම යති)

**කාශ්‍යප:** "පින්වත් වන වෘක්ෂ ලතාවෙනි! ඔබට ජලය නොදී කිසි කලෙකත් වතුර ටිකක්වත් පානය නොකල ඔබගේ ආදරණීය සොහොයුරිය අද ඔබ වෙතින් වෙන්ව යයි.

මේ මගේ දියණිය, මේ ඔබේ සොහොයුරිය, මල් වලට මහත් කැමැත්තක් දක්වයි. එහෙත් ඇය ඔබට අලුතෙන් පිපුණ මල් ඔබ කෙරෙහි ආදරයෙන් කඩා නොගනියි.

මේ වන වෘක්ෂ ලතාවන් කෙරෙහි මහත් ආදරයක් ද මහත් කරුණාවක් ද දක්වූ ඇය අද ඔබට ආයුබෝවන් කියමින් සිය සැමියා වෙත යයි. වන වෘක්ෂ ලතාවෙනි ඇයගේ ගමනට අවසර දෙන්න.

(කෝකිලෙකුගේ හඩක් ඇසෙයි)

ඔව්, ඔය ඇහෙන්නෙ මේ වනෙහි වෙසෙන ඇගේ නෑයන් වැනි වන වෘක්ෂ ලතාවන්ගේ අවසර දීමේ නාදයයි. (අහස දෙස බලමින්) හිරුඑසද ඇයගේ ගමනට අනුකූලතාවයක් දක්වන්නාක්මෙන් පවතියි. අධික සූර්‍ය්‍යසන්තාපයෙහි දී අතුපතර විහිදී ගිය වෘක්ෂයන්ගේ සෙවන ඇයට ලැබේවා." 'ජලජ පුෂ්පයන්ගේ සුවඳ ඇදගෙන එන සීතල මන්‍දමාරුතය ඇයගේ විඩාව දුරු කෙරේවා! මාර්‍ගයද ඇයට නිරුපද්‍රැත වේවා!"

**ගෞතමී:** "දූවේ! ඔබේ මේ ගමන දෙව් ලියෝද අනුමත කරති.

**සකුන්තලා:** "අනේ ප්‍රියංවද සැමියා වෙත යාමට සැරසුනත් මගේ පා මේ අසපුව අත් හැර යන්නේ ඉතාම අමාරුවෙනි."

**ප්‍රියංවද:** "ඔව් යෙහෙළිය, ඔබගේ වියෝගය දුටු මේ මුළු තපෝවනයම දුන් වැළපෙයි. බලන්න සොහොයුරිය අර මුව පොව්වා මුවෙන් ගත් ඊතණ දලුව බිම දමූ සැටි. බලන්න සොහොයුරිය! අර මොනරුන් රංචුව නොනටා සිටින හැටි"

සකුන්තලා: "පියාණෙනි, අර වනජෝත්සනා සොහොයුරිය මා ආදරයෙන් වැඩු සමන් පිච්ච වැල අත හැර ද මම කෙසේ යම් ද?"

කාශ්‍යප: "ඔව් දූවේ, ඔබ ඇයට තිබෙන ආදරය මම දනිමි."

සකුන්තලා: (වනජෝත්සනා වැල වෙතයයි) "අහෝ වනජෝත්සනා වැල අද මම ඔබ වෙතින් වෙන්ව යමි." "අනේ! (යෙහෙළියන් වෙත හැරී) වනජෝත්සනාවෙනි, ඔබ අද සිට මේ සොහොයුරියන් දෙදෙනාට බාරයි."

යෙහෙළියන් දෙදෙනා: (හඩමින්) අනේ සොහොයුරිය ඔබ අප දෙදෙනා බාර කරන්නේ කාට ද?"

කාශ්‍යප: "අනසූයා, අනසූයා, හඩන්න එපා. සකුන්තලා ධෛර්‍යවත් කළ යුතු වේලාවයි මේ."

(සියල්ලෝම සමන් පිච්චමල් වැල වෙතින් නික්ම යති)

සකුන්තලා: "තාත්තේ! මේ අසපුව කෙළවර ප්‍රසූතයට ආසන්නව මුව දෙනක් ඉන්නව. අනේ ඒ මුව දෙන ප්‍රසූත කලාම මට දන්වන්න."

කාශ්‍යප: හොඳයි දූවේ, ඒක මම මතක තියා ගන්නම්."

සකුන්තලා: "පියාණෙනි, මා පසු පස ගමන් කිරීමෙන් වෙහෙසට පත් නොවනු මැනවි. දැන් නවතිනු මැනවි."

සාර්ඞ්ගරව: "ගුරුදේවයාණෙනි, ජලාශයක් පෙනෙනතෙක් හෝ දිය කලයක් ගත් කෙනෙකු හමුවන තෙක් හෝ පසු ගමන් කිරීම හොඳය යන්න මම අහල තියෙනව. ඒ නිසා අර විල් ඉවුර තෙක් පැමිණෙනු මැනවි."

කාශ්‍යප: "එහෙනම් දරුවනි මේ කිරිපළු ගහ යට විඩා හරිමු."

සකුන්තලා: "අන්න බලන්න, අර නෙලුම් කොළ අතර සක්වා ධෙනුව. සිය පෙම්වතා නැතුව දුක්වෙන හැටි."

**අනසූයා**: ''යෙහෙළිය, මේ සකුන්තලාව මගේ වචනයෙන් ඔබ රජතුමාට හඳුන්වා දිය යුතුයි.''

**සාරංගරව**: ''හොඳමයි ගුරුදේවයාණනි.''

**කාශ්‍යප**: ''දුවේ, ඔබ නැදි මයිලන්ට කීකරුව වෙසෙන්ට ඕනෑ. ඔවුන් දක හුනස්නෙන් නැගිටින්නට ඕනෑ. ස්වාමියා කෙරෙහි භක්තිමත් වෙන්නට ඕනෑ. සිය යෙහෙළියන් කෙරෙහි මිත්‍රත්වය තබා ගන්නට ඕනෑ.''

**ගෞතමී**: ''දුවේ ඕවා තමයි ස්ත්‍රීන් විසින් පිළිපැදිය යුතු උපදෙස්. ඔය අවවාද අමතක කරන්නට එපා.''

**සකුන්තලා**: ''පියාණනි, මේ ප්‍රියංවදත් නවතිනවද?''

**කාශ්‍යප**: ''ඔව් ඒ දෙන්නගෙන් වැඩක් නැහැ ඔබත් සමග මේ ගෞතමිය යනව.''

**සකුන්තලා**: (පියා වැළඳ ගනිමින්) ''අහෝ පියාණනි ආදශ්‍රයේත්-ආරක්ෂාවේත්-පවිත්‍රතාවයේත්-මූර්තියක් වැනි වූ ඔබ වහන්සේ ගේ ඇසුරෙන් – ඔබ වහන්සේ ගේ ඇකයෙන් වෙන් වුන–ගිලිහුන මම සඳුන් රුකකින් ගිලිහුන ළ–පල්ලක් වැනිය. අහෝ ඔබගෙන් වෙන්ව මම කෙසේ ජීවත් වම්ද?''

**කාශ්‍යප**: ''දුවේ හඬන්න එපා, හඬන්න එපා.''

(පියාණන්ගේ පාමුල සකුන්තලා වැඳ වැටී නමස්කාර කරයි)

**කාශ්‍යප**: ''දුවේ, ඔබේ අදහස් ඉටුවේවා!''

**සකුන්තලා**: (යෙහෙළියන් දෙදෙනා වෙත හැරී) 'පියාණනි මේ මගේ යෙහෙළියන් දෙදෙනාටද මට මෙන් සලකනු මැනවි. මා වැනි කොට සළකනු මැනවි.''

**යෙහෙළියන් දෙදෙනා**: 'නැගණිය, රජතුමාට ඔබ අමතක වුවහොත් මතක ඇතුව රජුගේ නම කොටාපු මුද්ද පෙන්වන්න.''

G. WINDSOR
HEADQUARTERS SCOUT COMMISSIONER
...ERA MAWATHA,
MAGALLE - GALLE.



**සාරංගරව:** "දැන් හරියට දවල්වෙලා ඉක්මන් කරන එක හොඳයි."

**සකුන්තලා:** "පියාණනි, මේ රමණීය අසපුවට යළිත් මම කවද පැමිණෙම්ද?"

**කාශ්‍යප:** 'දුවේ, චතුර්විධ සාගරය සීමාකොට ඇති රාජ්‍යයක් පාලනය කරණ දුෂ්‍යන්ත රජුට ඔහු හා සමාන වූ පුතෙකු ලබාදී එම පුත්‍රයාට සුදුසු වයස පැමිණිවිට පිය රජු විසින් රාජ්‍ය සහිත ධනය පාවා දුන් කලෙක සිය සැමියා සමග ඔබ මෙහි පැමිණෙන්න."

**ගෞතමී:** "ඉතින් කතා කර කර ඉන්න එකෙන් වෙන්නේ ගමනට බාධා වෙන එකයි. කතා කර කර ඉන්න ඉන්න කතාව තව තවත් වැඩිවෙන එකයි"

**කාශ්‍යප:** (සුසුම් හෙළමින්) "දැන් ඉතින් ගමනට හොඳයි වේලාව. ඔබට සුව වේවා"

**සකුන්තලා:** "පියාණනි තවුස් වූත රැකීමෙන් දුඃඛිත වූ මේ ඔබ ශරීරය මා වෙනුවෙන් පීඩාවට පත් නොකරනු මැනවි. මා වෙනුවෙන් ශෝක නොවෙනු මැනවි."

**කාශ්‍යප:** (සුසුම් හෙළමින්) "අනේ දුවේ කුඩා කල පටන් මා විසින් ඇති දැඩිකළ ඔබ මගෙන් වෙන්ව යනවිට මම කෙසේ සැනසෙම්ද? මේ අසපුව ඉදිරිපිට ඔබගේ ළපටි අත් වලින් වගා කළ හැල් වී පඳුරු පෙනෙන විට මම කෙසේ වැවෙම්ද? දුවේ, යන්න ඔබට සුවපත් වේවා!"

(සකුන්තලාව පිරිවර සමග නික්ම යති.)

**යෙහෙළියන් දෙදෙනා:** "අහෝ, මේ වන රාජිය දැන් සකුන්තලාව ගෙන් වියෝවෙයි."

**කාශ්‍යප:** "යමු ඉතින්, අසපුවට ශෝක කිරීමෙන් වැඩක් නැහැ."

**යෙහෙළියන් දෙදෙනා:** "පියාණනි සකුන්තලාවගෙන් හිස්වූ මේ අසපුවට අපි කෙසේ යමුද?"

**කාශ්‍යප:** "දුවනි වරුනි, ආලයක හැටි ඔහොම තමයි. ඒ වුනාට සිය හිතවතිය සැපවත් බවට පැමිණි අවස්ථාවක දුක්වෙන එක හොඳ නැහැ. ඔබ නැළවෙන–ඔබ ජීවත් වෙන – මේ ආලයේ – මේ ස්නෙහයේ තොටිල්ලෙන් එහි නැලවෙන්නවුන්, වරින්වර ගිලිහෙන්නේ ඔය විධියට තමයි."

# 5 වන අංකය.

විදූෂක: "මධුර ගීත නාදයක් ඇසෙනව දේවයන් වහන්ස," හරිම කලාත්මකයි ඒක. එකත් එකට මේක හංස පතිකාවගේ හඩ වගෙයි."

රජු: "නිශ්ශබ්ද වෙන්න, නිශ්ශබ්ද වෙන්න, අපි අහමු ඒ ගීත නාදය" (රජු ගීත නාදය අසමින්) "හරි රාගාත්ම කයි ඒ ගීතය."

විදූෂක: "හොඳයි, දේවයන් වහන්ස ඒකේ අදහස තේරුණාද?"

රජු: (සිනාසී) "විදූෂක, හංස පතිකාවට කියන්න මේ ගීතයට මම පැහැදුන බව."

විදූෂක: "හොඳමයි, දේවයිනි."

(ඇමතියෙක් පැමිණෙයි.)

ඇමති: "ජයශ්‍රී දේවයන් වහන්ස, හිම ගිරෙහි උපත්‍යක ආරණ්‍යයෙහි වැසි වූ කාශ්‍යප සෘෂිවරයාගෙන් පණිවිඩ යක් රැගෙන කාන්තාවකුත් කැටුව තවුස් පිරිසක් ඇවිත් සිටිනවා."

රජු: 'මොනවා, කාශ්‍යප සෘෂිවරයා වෙතින්ද ඇවිල්ල ඉන්නේ."

ඇමති: "ඉතින් දේවයන් වහන්ස, ඔවුන්ට මොනවද කියන්නේ."

රජු: "එහෙනම් උපාධ්‍යාය, සෝමරාත්‍රට කථා කරලා කියන්න." මේ තවුස් පිරිසට චාරිත්‍රානු කූලව සංග්‍රහ කරන්න කියලා."

ඇමති: "හොඳමයි දේවයන් වහන්ස,"

රජු: "වෙත්‍රවතිය, (ද්වාරපාලිය) ඒ අමුත්තන්ට මාර්ගය පෙන්වන්න."

**ද්වාරපාලිය:** "මෙහෙන් එන්න, මෙහෙන් එන්න,"

(සකුන්තලාව සහිත තවුස් වරු පැමිණෙති.)

**සකුන්තලා:** "මගේ වම් ඇහැ නටනවා. මොකද දන්නෙ නැහැ."

**ගෞතමී:** "ඔය අගුණ කාලය ගතවෙලා වෙන්න ඇති, ඒකේ ලකුණක් ඒ."

**සොමරාත්‍ර:** (පුරොහිත) "තාපසවරුනි, දේවයන් වහන්ස වැඩ ඉන්නේ මෙහෙ."

(තවුස් පිරිස රජුවෙත පැමිණෙයි.)

**රජු:** "කව්ද ඒ එන තරුණිය?"

**ද්වාරපාලිය:** "කව්රු වුවත් කදිම රුවක්, මගේ හිතේ ලොකුම සැකයක් ඇති වුනා දේවයන් වහන්ස."

**රජු:** "ඔව්, ඇය ලක්ෂණ තමා, ඒ වුනාට අනුන්ගේ ස්ත්‍රීන් වර්ණනාකරණ එක හොඳ නැහැ නොවැ."

(පුරෝහිත රජු ඉදිරියට පැමිණෙයි.)

**පුරෝහිත:** "දේවයන් වහන්ස චාරිත්‍රානුකූලව අමුත්තන්ට සංග්‍රහ කොට අවසානයි. මේ තවුසන් ඇවිල්ල ඉන්නේ කාශ්‍යප ඍෂි වරයාගේ පණිවුඩයක් ඇරගෙන, එය අසනු මැනවි."

**රජු:** "හොඳයි. හොඳයි,

**තාපසවරු:** ජයශ්‍රී රජතුමනි."

**රජු:** "ඔබ වහන්සේලා සියලු දෙනාම නමස්කාර පූර්වකව පිළිගනිමි."

**තාපසවරු:** "සුවපත් වේවා රජතුමනි!"

**රජු:** "කොහොමද? ඔබවහන්සේලාට සැප සනීප?"

තාපසවරු: "ඔබ වැනි ධාර්මිකයෙකු රට පාලනය කරණ විට අපට කරදර ඇති වන්නේ කෙසේද? සූර්‍ය්‍යයා උදය ගිරියෙන් පායන විට අඳුර දුරුවන්නාක්මෙන් ඔබ ලොව පාලනය කරණ විට උවදුරු දුරුවෙයි."

රජු: "ඔව් එහෙම නම් රාජ ශබ්දය අන්වර්ත්ය. ලොවට අනුකම්පාව පිණිස කටයුතු කරණ කාශ්‍යප මහර්ෂිවරයාගේ සුව දුක් කෙසේද?"

තාපසවරු: "උන්වහන්සේ සුවසේ වෙසෙති. ඔබගේ සුව දුක්ද උන්වහන්සේ අසති."

ශාරඞ්ගරව: "එපමණක් නො වෙ යි. මේ පණිවිඩයකුත් එවල තියෙනව."

රජු: "හොඳමයි. ඒ පණිවිඩය කියන්න."

ශාරඞ්ගරව: "එද ඔබ ගාන්ධර්ව විවාහයට පත් කර ගත් සකුන්තලාව අප සමඟ ඇවිත් සිටියි. දැන් ඇය ගර්භිනියකි. ඇයට ගැබ් පෙළහැර දීමට සුදුසු කාලයයි මේ. එහෙයින් ඇය බාර ගන්නා ලෙස කාශ්‍යප මහර්ෂිතුමා ඔබ තුමන්ට දන්වති."

(රජු කලබල ගතියක් දක්වා නිශ්ශබ්ද වෙයි.)

ගෞතමී: "රජතුමනි, ඇයි නිශ්ශබ්දව ඉන්නේ?"

රජු: "මේක මොකක්ද කියල මට නම් තේරෙන්නේ නැහැ."

සකුන්තලා: "ගින්නට පැන්නාම තමයි මේක තේරෙන්නේ"

රජු: "ඔබ කියන්නේ, මම ඔබ සමග විවාහ වුනයි කියලද."

සකුන්තලා: (සුසුම් හෙළමින්) "අයියෝ! ඔබ තුමන්ට අමතක වෙලා තිබෙන හැටි."

රජු: "හරි චෝදනාවක් නොවැ."

**ගෞතමී:** ''දුවේ, ලජ්ජා වෙන්න එපා! ඔය ශීර්ෂාවරණය පොඩ්ඩක් ඉවත් කරන්න. එතකොට ඔබ හඳුනා ගනීවි.''

(සකුන්තලා ශීර්ෂාවරණය ඉවත් කරයි. රජු ඇය දෙසම බලාගත් වනම ඉඳ කල්පනා කරයි.)

**ද්වාරපාලියා:** ''පුදුමයි, මෙතරම් ලස්සන කාන්තාවක් දැක ලත් රජතුමා කල්පනා කරන හැටි.''

**සාරඞ්ගරව:** ඇයි? රජතුමනි නිශ්ශබ්දව ඉන්නේ?''

**රජු:** ''තාපසවරුනි! මා සිටියේ නිශ්ශබ්දව නොවේ. මෙතෙක් කල්පනා කෙළේ මැය ගැනමයි. සැක සහිතව මේ ගැබිනිය මා බාරගන්නේ කෙසේ ද?''

**සකුන්තලා:** ''අහෝ මේ රජුට විවාහය පවා අමතකවී තිබෙන හැටි. මෙතන ඉඳීමෙන් වැඩක් නැහැ අපි යමු.''

**සාර්ඞ්ගරව:** ''හා හා එහෙම එපා! අපි තව ටිකක් බලමු.''

**සාරද්වත:** ''සාරඞ්ගරව, දැන් ටිකක් විවේක ගන්න. සකුන්තලා, දැන් අප විසින් කිය යුතු දේවල් නම් කියල අවසානයි. ඔබටත් කියයුතු දෙයක් තිබෙනවා නම් කියන්න.''

**සකුන්තලා:** ''රජතුමනි, හදවතට දුක් දෙන වචන වලින් කතා නොකරනු මැනවි. එද අසපුවෙහි දී වූ ගාන්ධර්ව විවාහය අමතක කිරීම රාජනාමයට ගෞරවයක් නොවෙයි. හොඳයි ඔබතුමන්ට එය අමතක නම් මතක් කිරීමට දෙයක් මා ළඟ තිබේ.''

**රජු:** (කන්දෙක වසාගනී) ''නො ඇසෙන එක වැඩියෙ හොඳයි.''

**සකුන්තලා:** (සිය අතෙහි ඇඟිල්ල දෙස බලයි.) ''අහෝ අවාසනාවක මහත! කෝ මගේ ඇඟිල්ලේ තිබුන මුද්ද?''

(කලබලයෙන් ගෞතමිය දෙස බලයි.)

G. WINDSOR
HEADQUARTERS SCOUT COMMISSIONER
278, L. E. PERERA MAWATHA,
MAGALLE - GALLE.



ගෞතමී: "හා! හා! ඔන්න මට මතකයි, අන්න අර සචී තීර්ථයෙහි ඇවිද්ද වේලාවෙහි ඔය මුද්ද වැටෙන්න ඇති."

රජු: (සිනාසී) ඕක තමයි ස්ත්‍රීන්ගේ කතා විශ්වාස කරන්න බැරිය කියන්නේ."

සකුන්තලා: "හොඳයි, දෛවයට මා පැරදුනාවේ. මම තවත් කාරණයක් මතක් කරන්නම්."

රජු: "හොඳයි, හොඳයි, කියන්න."

සකුන්තලා: "එක දවසක් අර අසපුවෙ ලතා මණ්ඩපයෙහිදී ජලයෙන් පිරෙව් නෙළුම් ගොටුවක් ගෙන ඔබ හිටියා ඔබට මතකද?"

රජු: "හොඳයි, ඉතින් කියන්නකෝ."

සකුන්තලා: "එහෙම ඉන්න කොට ඔබ ළඟට මගේ පුත්‍රයෙකු වැනි දීඝාපාඞ්ග නැමති මුව පොතකයෙක් ළඟට ආවා. එද ඔබ සූදනම් වුනා ඌට වතුර පොවන්න. එවිට ඌ පැනගියා. වතුර ගොටුව මගේ අතට ගත්තම යලිත් ඌ මා වෙත ඇවිත් වතුර බිව්වා. එවිට විශ්වාසියකු ගේ අතින් මුව පොව්වකු වතුර බොන හැටි කියා කියා ඔබ සිනාසුනා."

රජු: "තමන්ගේම වාසියට කතා කරණ ඔය ගැහැණුන්ගේ කතා කාටද විශ්වාස ?"

ගෞතමී: "තපෝ වනයෙහි වැඩුනු මැයට ඔය විධියට කතා කිරීම නුසුදුසුයි."

රජු: "තාපස මාතාවෙනි, අසත්‍යය පවා සත්‍යය කොට කීමට ස්ත්‍රීහු සමර්ථ වෙති. ඔවුන්ගේ ව්‍යක්ත කම එතරම්ය. පරපුටුවන් වැනිව ජීවත්වන ඔවුන්ගේ සූරකම්ද එතරම්ය."

**සකුන්තලා:** (කෝපයෙන්) "තමාට තමාම විශ්වාස නැති දුෂ්ටය. තමාගේ මිම්මෙන් අනුන් නොමනිනු මැනවි. රාජ ධර්මයේ නාමයෙන් වැසී සිටින ඔබ වන ගහනයෙන් වැසුනු ළිඳක් වැනිය."

**සාරද්වත:** "මේ ඉඳීමෙන් වැඩක් නැහැ අපි යමු."

**සකුන්තලා:** (හඬමින්) "මට සිදු වුන දේ ගැන දැන් කරන්ට දෙයක් නැහැ. මා දමලා ඔබවහන්සේලා යන්න. අයියෝ! මහිමාතාව ඇයි ඔබ මා උසුලාගෙන ඉන්නේ."

**රජු:** "පුරෝහිතයාණනි, දැන් ඉතින් මෙයට කුමක් කර මුද?"

**පුරෝහිත:** "දැන් මෙයට කරන්න තියෙන්නෙ මේකයි."

**රජු:** හොඳයි එය කියනු මැනවි.

**පුරෝහිත:** "මැය මෙහි නවත්වා ගන්න දරුවෙකු ප්‍රසූත කරනකන්වත්. ඔබේ ප්‍රථම පුත්‍රයා චක්‍රවර්තියෙකු වන බව ඔබ දන්නව නේ. මුනි දුහිතෘවකගෙ පුත්‍රයෙක්ද ඒ ලක්ෂණ වලින් යුක්ත වනු ඇති. එහෙයින් මැය ඔබගේ අන්තඃ පුරයට ඇතුළත් කරණු මැනවි."

**රජු:** "ඔබගේ කැමැත්තක්."

**පුරෝහිත:** "දරුව, මාත් සමග මෙහි එනු මැනවි."

**සකුන්තලා:** (හඬමින්) "මහිමාතාවෙනි, ඇයි මා ඔබ තව දුරටත් උසුලා ගෙන ඉන්නේ?"

**රජු:** (සවන් දෙමින්) "මොකද ඒ හඬන්නේ?"

**පුරෝහිත:** "දේවයන් වහන්ස, ඇය හඬා වැළපෙයි."

**රජු:** ද්වාරපාලිය, මගේ සිත අවුල් - වියවුල් වී ගියා. සයනාගාරයට යන පාර පෙන්වන්න."

**වාරපාලිය:** "රජතුමනි, රජතුමනි, මෙහෙන් යහපත් වෙන්න! මෙහෙන් යහපත් වෙන්න!

## 6 වන අංකය.

(නගර පරීක්ෂකයෙකුත් නගරාරක්ෂක හටයන් දෙදෙනෙකුත් මිනිසෙකු මාංචු දමාගෙන පැමිණෙති)

**නගරාරක්ෂක හටයන් දෙදෙනා:** (තලමින්) "කියාපිය හොරා. තෝ එය රජ්ජුරුවන්ගේ මුද්ද කොහේදි ගත්තද කියල?"

**මිනිසා:** "කරුණාවෙන් කථා කරන්නකෝ. මම ඔය ජීවත විධියේ මිනිහෙක් නොවේ."

**ප්‍රථම ආරක්ෂක හටයා:** "හඃ! හඃ! හරි නම්බු කාරයෙක්. මෙන්න බොලේ බ්‍රහ්මණයෙක්."

**මිනිසා:** "කරුණාකර මන් කියන එකට ඇහුන්කන් දෙන්න. මම ශක්‍රාවතාර තීර්ථයෙහි වෙසෙන මසුන් මරන්නෙක්."

**දෙවන ආරක්ෂකයා:** (තලමින්) "කව්ද බොල තොගෙන් ජාතිය ඇහුව්වෙ?

**නගර පරීක්ෂක තුමා:** සූචක, ඔකගෙන් අහමු අපි ඔක් කොම තොරතුරු. අපි ඔක බඳිමු මෙතන."

**මිනිසා:** "මම දැල් ගසා මසුන් අල්ලමින් අඹු දරුවන් පොෂණය කරන්නෙක්මි."

**නගර පරීක්ෂක තුමා:** "හරි වැදගත් රක්ෂාවක් නොවැ."

**මිනිසා:** "ඔව්! අපි වගේ දුප්පත් මිනිහෙකුට ජීවිතේ ආරක්ෂා කර ගැනීමට මසුන් මරණ එකයි නරක. බමුණන් වගේ රජවරුන් වගේ ඉහළ පෙළෙ අය දහස් ගණන් අහිංසක සිව්පාවුන් මරාදැමීම ඇයි පහත් වැඩක් හැටියට නොසළකන්නේ."

**නගර පරීක්ෂක තුමා:** "ඉතින් ආඩම්බර නැතුව ඇත්ත කියාපිය."

**මිනිසා:** ''එක දවසක් මගේ දැලට අසුවුනා රෝහිත මත්ස්‍යයෙක්. ඌ ආහාරය පිණිස ගෙදර ගෙන ගියා. ඒකගෙ බඩ පැලුවම මේ මුද්ද එහි තිබුණා. මුද්ද අරගෙන මම අර කඩේට ආව. එතකොට තමයි මේ අහුඋනේ. ඔබවහන්සේලාට ඕනෑනම් මා මරන්න. නැත්නම් මුදවා හරින්න. ඔක තමයි මේ මුද්දෙහි සත්‍ය කථාව.''

**නගර පරීක්ෂක තුමා:** ''මේ මිනිහා මසුන් මරන්නෙකුම වෙන්න ඇති. දැන් අපට සොයාගන්න තිබෙන්නේ මේ මුද්ද ගැනම යි. ඒක නිසා දැන් රජ ගෙදරට යමු.''

**ආරක්ෂක භටයන් දෙදෙනා:** ''හොඳයි එහෙනම් යමු යමු.''

**නගර පරීක්ෂක තුමා:** ''එහෙනම් නුඹලා දෙදෙනා මේ දොරටුව ළඟ මේ මිනිහාත් බලාගෙන ඉන්න ඕනෑ. මම රජ ගෙදරට ගිහිල්ල එන්නම්.''

**ආරක්ෂක භටයන් දෙදෙනා:** ''හොඳයි, හොඳයි මේ මුද්ද දැක්කම රජ තුමා හොඳටම සතුටු වේවි.''

(නගර පරීක්ෂක තුමා රජ ගෙදරට පිවිසෙති.)

**ප්‍රථම ආරක්ෂක භටයා:** ''මොකද දන්නෙ නැහැ ආපහු එන්න මෙච්චර ප්‍රමාද වෙන්නේ.''

**ද්විතීය ආරක්ෂක භටයා:** ''රජ තුමා හමුවුනේ නැතුව වෙන්න ඇති.''

**ප්‍රථම ආරක්ෂක භටයා:** (මිනිසා දෙස අත දිගු කරමින්) ''ජානුක, මගේ අත් ගොබ නටනවා මූට දෙකක් තුනක් ගහන්ට බැරිවුනාට.''

**මිනිසා:** ''ඇයි, අහිංසක මට එහෙම කියන්නේ.''

**ද්විතීය ආරක්ෂක භටයා:** ''හෝ ඔය එනව පෙනෙන්නේ නගර ආරක්ෂක තුමා. මූගේ ඉරණම මොකක් වේවිද දන්නේ නැහැ.''

නගර පරික්ෂක තුමා: ''සූචක, මුද්‍රපත් ඔය මිනිහා, මුද්ද ලැබිල තියෙන හැටි දැනගෙන දැන් අවසානයි.''

සූචක: ''හොඳයි, හොඳයි ඔන්න ලිහුවා.''

විජය ආරක්ෂක හටයා: මාරයාගේ කටටම යන්න ගිහිල්ලා මේ මිනිහා බේරුණ හැටි.''

මිනිසා: ''මහතාණනි, ඉතින් මගේ ඉරණම කුමක්ද?''

නගර පරික්ෂක තුමා: ''ඉරණම අනිකක් නෙවි. මුද්දට වටින තරම් මුදලක් ඔබට තෑගි වශයෙන් ලැබුණා''

මිනිසා: ''අනේ ඔබ තුමාට ස්තුති යි.''

සූචක: ''පුදුමයි, පුදුමයි. උළ හිඳුවන්නට නියම කරපු මිනිහා සම්පතකට හිමිවුන හැටි.

ජානුක: ''මේ මුද්ද හුඟක් වටිනා එකක් වගෙයි. නැත් නම් රජ්ජුරුවෝ මේ තරම් සැලකිල්ලක් දක්වන්නේ නැහැ.''

නගර පරික්ෂක තුමා: ''මුද්දේ වටිනාකම නිසා නොවෙ. මේ මුද්ද දුටු හැටියේ රජතුමාට අමතක වෙලා තිබුන දෙයක් මතක් වුනා.''

ජානුක: ''පුරුෂයා දෙස ඊෂ්‍යා සහගත ලෙස බලමින්, කොහොමද නිකම්ම යන්නද කල්පනාව?''

මිනිසා: ''නැහැ, නැහැ, මෙයින් භාගයක් ඔබ තුමන්ට.''

ජානුක: ''අන්න හොඳයි අදහස.''

නගර පරික්ෂක තුමා: ''හා! හා! එහෙනම් යමු තැබෑරුමට.''

(සියල්ලෝම නික්ම යති)

(ඉක්බිති සානුමතී නම් දෙවඟනක් අහස් යානයකින් පැමිණෙයි.)

**සානුමතී:** (තමාටම) "මේ දවස්වල මා මේ තීර්ථයට පැමිණ සිටින්නේ සාදු ජනයා ජලස්නානයට මෙහි පැමිණෙන නිසාය. දැන් මේ රජතුමාට සකුන්තලා පිළිබඳ වෘත්තාව ප්‍රත්‍යක්ෂ කරවන්නෙමි. මේ වසන්ත කාලයෙහිත් රජ ගෙදර කිසිම උත්සව විලාශයක් නැත්තේ කුමක් නිසාදැ යි නො දනිමි. හොඳයි, එය ඔය එන උද්‍යාන පාලිකාවන්ගෙන් මම අසන්නෙමි."

(ඉක්බිති දසියක් මී අඹ දලුවක් දෙස බලමින් තවත් දසියක සමග පැමිණෙයි.)

**ප්‍රථම දසිය:** "අනේ මී අඹ දලුව, මේ වසන්ත කාලයෙහි ඔබ අගේ ඇති ආභරණයකි."

**ද්විතීය දසිය:** "ඇයි පරභෘතිකා තනියම කතා කරන්නේ."

**ප්‍රථම දසිය:** "නැහැ මධුකරිකා, මේ මී අඹ දලුව දකින කොට මගේ හිත පරභෘතිකා බවට පත්වුනා—කෝකිලාවක් බවට පත් වුනා."

**ද්විතීය දසිය:** "ඕ–හෝ මේ වසන්ත කාලය නොවේද?"

**ප්‍රථම දසිය:** "ඔව්, ඔව් මේක තමයි කාමයෙන් මෝහනය වූවන්ගේ කාලය."

**ද්විතීය දසිය:** "යෙහෙළිය, මා ඔසවාගෙන ඉන්න අර මී අඹ දලුව කඩාගන්නකන්. ඒක කඩාගෙන අපට පූළුවන් කාමදේවයා පුදන්ට."

**ප්‍රථම දසිය:** "ඔව්, ඔව් මටත් බාගයක් ලැබේවි ඒකෙන්."

(ඇමතියෙක් පැමිණෙයි.)

**ඇමති:** හා! හා! එපා, එපා කඩන්න. රජ තුමා තහනම් කරලා තියෙන්නේ."

**දසියන් දෙදෙනා:** "සමා වෙන්න ඇමති තුමානෙනි–අපි දන්නේ නැතුවයි එය කඩන්ට හැදුවෙ."

**ඇමති:** "හොඳයි, හොඳයි, මීළඟට නැවතත් සැරසෙන්ට එපා අඹ දලු කඩන්ට"

ළඳුන් දෙදෙනා: "ඇමති තුමනි! මොකද මේ දවස්වල රජතුමා තහනම් කරල තියෙන්නේ."

ඇමති: "ඔව්, ඔව්, ඇත්තමයි. මනුෂ්‍යයෝ නම් උත්සවයන් ප්‍රිය වර්ගයකි. මේ උත්සවය වළක්වල තියෙන්නේ ලොකුම කාරණයක් නිසා වෙන්න ඇති."

ඇමති: "ඇයි අහල නැද්ද මේ ප්‍රවෘත්තිය, මේ සකුන්තලා ගේ ප්‍රවෘත්තිය."

ළඳුන් දෙදෙනා: "සකුන්තලාවක් ගැන අපි අහල නැහැ. මින්න ඔය මුද්දක කතාවක් නම් කටින් කට ඇහිල තියෙනව."

ඇමති: (කන් යොමු කරමින්) "දේවයන් වහන්සේ දූන් මෙහි පැමිණේවි."

ළඳුන් දෙදෙනා: "එහෙමද?"

(ඇලා නික්ම යති)

(රජු විදූෂකත් සේවිකාවකුත් කැටුව පැමිණෙයි)

ඇමති: (රජුට පෙර ගමන් කරමින්) "ජයශ්‍රී දේවයන් වහන්ස." "මේ උද්‍යානයෙහි කැමති තැනක වැඩ සිදිනු මැනවි."

රජු: "අර ආයර්‍යපිසුන–ඇමතියාට මෙන්න මේ පණිවිඩය ඇරගෙන ගිහිල්ල දීපන්"

සේවිකාව: "හොඳමයි දේවයන් වහන්ස"

(ඇය නික්ම යයි)

රජු: "ඇයි, වාතායන, උඹ මෙහෙම හිටියම කොහොමද උයන පරෙස්සන් කරන්නේ. මගේ නියෝගය කඩ කරන්න එපා."

ඇමති: "හොඳමයි දේවයන් වහන්ස!" (ඔහු නික්ම යයි)

විදූෂක: "දේවයන් වහන්ස කොහොම කොහොම හරි ඒ දෙන්නා පිටත් කළා නොවැ. කොච්චර ලස්සනද මේ උද්‍යානය!."

කොව

**රජු:** "උද්‍යානය නම් ලස්සන තමයි. ඒ වුනාට මෙහි තිබෙන අනංග පීඩාව තමයි ඉවසන්නට ම බැරි."

**විදූෂක:** "හොඳමයි දේවයන් වහන්ස! ඔහොම හිටින්න පොඩ්ඩක් මම මේ හැරමිටියෙන් ඔය අනංගයාට ගහන්නම්."

**රජු:** (සිනාසෙමින්) "වෙන්න පුළුවන් ඒ වුනාට මේ වෘක්ෂ වැළඳ ගත් ලතාවන් පෙනෙන විට මට මගේ ප්‍රියාව අමතක කළ හැකිද?"

**විදූෂක:** "ඔබගේ අතින්ම ඇඳපු සකුන්තලාගේ චිත්‍රය සහිත පුවරුවක් අර මාධවී මණ්ඩපයෙහි තියෙනවා නොවෙද?"

**රජු:** "ඔව් ඇත්තෙන්ම ඒ ස්ථානය මගේ හදවත සනසවන්නකි" "අපි එතනට යමු."

(රජු විදූෂක ද කැටුව චිත්‍ර පුවරුව දෙසට යයි. සානුමතියද ඔවුන් කැටුව පසුපස යයි.)

**විදූෂක:** "බලන්න දේවයන් වහන්ස මැණික් ගල් තලාවකින් යුක්ත මේ මාධවී ලතා මණ්ඩපය ඔබවහන්සේට ආශීර්වාද කරන්නාක් මෙන් පවතින හැටි. මෙහි පිවිස වැඩ හිඳිනු මැනවි."

(රජු සහ විදූෂක ලතා මණ්ඩපයෙහි හිඳ ගනිති. මේ අතර සානුමතිය, වැල්වලින් වැඩී ගිය සකුන්තලාගේ චිත්‍රය සහිත ප්‍රතිරූපය වැල් වලින් ඉවත් කොට රජුට පෙනෙන්නට සළස්වයි.)

**රජු:** "විදූෂක, සකුන්තලා පිළිබඳ පෙර සිදුවීම් මට දැන් සිහි වෙනවා. මම ඒ සිදුවීම් ඔබට කියල ඇති නේ. මතක තියෙනවද දන්නේ නැහැ."

**විදූෂක:** "දේවයන් වහන්ස! මට නම් මතක නැහැ. මේ මැටි මොළයට ඕවා හිතේ තියාගන්න හරිම අමාරුයි."

**රජු:** (සුසුම් හෙළමින්) "විදූෂක, මා ආරක්ෂා කර ගන්න."

විදූෂක: "දේවයන් වහන්ස! දේවයන් වහන්ස! ඔය විධියට හිතන එක වැරදියි. පර්වතයක් මෙන් නොසැලී සිටින්න."

රජු: "ප්‍රියාව ගැන සිහිවන විට මම කෙසේ නොසැලී සිටිම්ද?"

සානුමතී: "අහෝ! මේ රජුගේ සන්තාපය මටත් ඉවසිය නොහැක."

විදූෂක: "රජතුමනි! මට සැකයක් ඇති වෙලා තියෙනව. කවුරු හරි ආකාශචාරියකු විසින් එදා ඇය ගෙනියන්න ඇතෙයි කියල."

සානුමතී: "සැක කරන්ට දෙයක් නැහැ."

විදූෂක: "මම හිතන්නේ ඇය කවද හරි සම්බ වෙවි කියලයි."

රජු: "ඒ කොහොමද?"

විදූෂක: "ඇගේ මව්පියන් වත් ඈ සොයා ගනීවි."

රජු: "ඔය අනුමාන ගැන කාටද විශ්වාස කරන්න පුළුවන්."

විදූෂක:- "මේ මුද්දම ඒකට නිදර්ශනයක් නොවැ. නැති වුන මුද්දත් සම්බ වුනානේ."

රජු: (මුද්ද දෙස බලමින්) අහෝ සුදුසුම ස්ථානයෙන් මේ මුද්ද ගිලිහුන හැටි.

සානුමතී: "ඉතින්, ආයිමත් තමාගේ අතටම ආවාම ශෝක කරන්නේ මොකෝ."

විදූෂක: "හොඳයි, මේ මුද්ද ඇගේ අතට ගියේ කොහොමද?"

රජු: "ඔන්න එහෙනම් අහන්න, එදා අසපුවෙහි සිට නගරයට ඒමට සූදානම වෙද්දි හඬා වැළපුන සකුන්තලාට මේ මුද්ද දුන්නා."

විදූෂක: "ඉතින්, ඉතින්"

රජු: "මේ මුද්ද ඇයගේ ඇඟිල්ලෙහි පළඳවන ගමන් මෙහි මගේ නම කෙටූ එක එක අකුර දිනපතා ගණන් කරන්නෙයි කියල කිව්වා. අවසන් වශයෙන් කිව්වේ අන්තිම අකුර ගණන් කළ ද ඔබ, සැමියාගේ කුළයට යන බවයි. අහෝ එහෙම කිව් මට ඇය අමතක වුන හැටි."

විදූෂක: හොඳයි, මේ මුද්ද රෝහිත මත්සායයාගේ කුස තුළට ගියේ කොහොමද?"

රජු: "මෙහි පැමිණීමට පිටත්වුන සකුන්තලා දවසක් සචී තීරයෙහි වන්දනා කරමින් සිටියා. එහිදී ඇඟිල්ලෙන් ගිලිහුනා මේ මුද්ද"

විදූෂක: "ඔව් දේවයන් වහන්ස, එසේම වෙන්ට ඇති."

රජු: (මුද්ද දෙස බලමින්) "අහෝ මේ මුද්ද ඇගේ කෝමළ ඇඟිල්ලෙන් ඉවත්වුනේ කෙසේද? නැහැ එය එතරම් පුදුමයක් නොවෙයි. සිත් පිත් නැති මුද්ද ඒ ඇඟිල්ලෙන්, මගේ හිතත් ඇගෙන් වෙන්ව තිබුණු හැටි."

(චිත්‍ර පුවරුවක් අතින් ගත් චතුරිකා පැමිණෙයි.)

චතුරිකා: "මෙන්න මේ චිත්‍රය"

(චිත්‍ර පුවරුව දක්වයි)

සානුමතී: "අහෝ, මේ රජතුමා චිත්‍ර ඇඳීමටත් හරි දක්ෂයි නේ." "මට නම් හිතෙන්නේ සකුන්තලාව දැන් මගේ ඉදිරියේ ඉන්නවයි කියල."

රජු: "ඔය තෙලි කූරෙහි මහිම තමයි."

විදූෂක: රජ තුමනි, මේ පින්තූරෙහි තුන්දෙනෙක් ඉන්නව. ඒ ඔක්කොම හරි ලස්සනයි. හොඳයි, කව්ද මෙතනින් සකුන්තලා."

රජු: "පුළුවන් නම් ඔබම හිතල කියන්න සකුන්තලා කවුද කියල?"

HEADQUARTERS SCOUT COMMISSIONER GALLE

විදූෂක: "මට හිතෙනුහැටියට මේ නීලවර්ණ කෙශ කලාපය විදහාගෙන, ළ-පල්ලෙන් ගහනි, අඹ ගහ ලඟම ඉන්නේ සකුන්තලාව කියලයි. අනිත් අය ඇයගේ යෙහෙළියෝ."

රජු: "හරිම දක්ෂයෙක් නේ විදූෂක."

"චතුරිකා, ගේන්න අර තෙළිකූර"

චතුරිකා: "විදූෂක, මේ චිත්‍ර පුවරුව මා එන කල් අල්ලගෙන ඉන්න."

රජු: "නැහැ නැහැ මම ඒක අල්ලගෙන ඉන්නම්."

(චතුරිකා පෙරලා එයි)

චතුරිකා: "මෙන්න තෙළිකූරයි, පාට පෙට්ටියයි ගෙනාව. වසුමතී දේවිය (මව්) මෙහි පැමිණීමට උතුරු සළුව අඳින කොට තමයි මමත් මේක අරගෙන ඉක්මන් කරල ආවේ. අන්න සේවිකාවකුත් එනවා."

(සේවිකාවක් පැමිණෙයි)

සේවිකාව: "ජයශ්‍රී දේවයන් වහන්ස!"

රජු: "ඔබ, වසුමතී දේවිය මෙහාට එනව දැක්කද?"

සේවිකාව: "එහෙමයි දේවයන් වහන්ස! මේ ලියුමක් රැගෙන එන මා දැකල එතුමී ආපසු හැරී ගියා."

රජු: "කෝ ඔය ගෙනා ලියුම.?"

(රජු සේවිකාව අතින් ලියුම ගෙන කියවයි.)

රජතුමනි;

ධනමිත්‍ර නම් වෙළෙන්ද නාවුක අනතුරකින් මිය ගිය බව දනගන්නට තිබේ. ඔහු පුත්‍රයන් නැති කෙනෙකි. ඔහුගේ ධනය රජය සතු වෙයි. දරුවන් නැති වීම කොතරම් දුඃඛිත කාරණයක්ද? (රජ සුසුම් හෙළයි)

**සේවිකාව:** ''ඇයි දේවයන් වහන්ස! දැන් නරක කාලය ඉවරයි නේ.''

**චතුරිකා:** මේ ලියුමෙන් පසුව රජතුමා නැවතත් ශෝකයට වැටුන වගෙයි. හොඳයි මම විදූෂක කැඳවගෙන එන්නම්කෝ.''

**ඈතින් ඇසෙන හඬක්:** ''අයියෝ! මා බේරාගන්න, අයියෝ! මා බේරාගන්න. අනේ—අයියෝ–මා–බේරාගන්න.''

**රජු:** (කලබලයට පත්වෙමින්) ''මොකද? මොකද? ඒ අර විදූෂක නේද කෑගහන්නේ.''

**සේවිකාව:** (වේගයෙන් ඇවුත්) ''අනේ! අර විදූෂක ඉක්මනට ගිහිල්ලා බේරා ගන්න.''

**රජු:** ''කවුද,—කවුද? ඒ''

**සේවිකාව:** ''දන්නේ නැහැ දේවයන් වහන්ස! කවුදෝ නොපෙනෙන ශරීරයකින් පැමිණ විදූෂක තුමා අර ගෙයි වහළ උඩට ඇදගෙන ගියා.''

**රජු:** (වේගයෙන් නැගිටිමින්) මොකාට වුනත් මෙහෙ ඇවිල්ල එහෙම වැඩ කරන්ට පුළුවන්ද? යමු, යමු, බලන්ට.''

(රජු විදූෂක බැලීමට දුවයි)

**රජු:** ''බය වෙන්නට එපා, බය වෙන්නට එපා. මගේ ඊතලය ඔබ ආරක්ෂා කරාවි.''

(මාතලී විදූෂක මුදා හරී.)

**මාතලී:** ''රජතුමනි,''

**රජු:** ''ඕහෝ, මේ මාතලී නේ. ආයුබෝවන් මාතලී.''

**මාතලී:** (සිනාසෙමින්) රජතුමනි! මම ආවේ සක්දෙව් රජුගේ පණිවිඩයකට. ඔබ දන්නවද 'දුජය' කියල අසුර සමූහයක් ඉන්න බව?.

රජු: "ඔව මටත් දවසක් අහන්ට ලැබුනා 'නාරද' සෘෂිවරයා ගෙන්"

මාතලී: "දන් ඔබ තුමා, මේ සක්දෙව් රජතුමාගේ රථයට නැඟිල ඒ අසුරයන් විනාශ කිරීමට යන්න ඕනෑ."

රජු: "සක්දෙව් රජුගේ නියමය ගෞරවයෙන් පිළිගනිමි. හොඳයි-ඒ විධියේ පණිවිඩයකට ඇවිල්ලා අර විදූෂ-කට කරදර කළේ කුමක් නිසාද?"

මාතලී: "මම දක්ක ඔබ ලොකු ශෝකයකින් ඉන්න බව. මම ඒ වැඩේ කළේ ඔබේ ඒ ශෝකය අත්හරවන්න."

රජු: (සේවක ජනයා වෙත හැරී) "සක්දෙව් රජුගේ ඉල්ලීම ඉටු කළ යුතුය. එහෙයින් මගේ ගමන ගැන අමාත්‍ය 'පිසුනට' දන්වන්න"

විදූෂක: "හොඳමයි, දේවයන් වහන්ස!"

මාතලී: "නගින්න, මහරජතුමනි මේ රථයට."

# 7 වන අංකය

(දුෂ්‍යන්ත රජුත් මාතලිත් අහස් යානයකින් ගමන් කරති)

රජු: "මේ භූවන්තලයට නැගුන විට තමයි මනුෂ්‍ය ලෝකයේ ඇති සෞන්දර්යය පෙනෙන්නේ. අර ගංගා, අර මුහුදු තීර අර නගර පෙනෙන හැටි."

මාතලී: "ඔව්, ඔව් රජ තුමනි."

රජු: "අර මේඝයක් වගේ පෙනෙන කන්ද මොකක්ද?"

මාතලී: "ඒක තමයි තවුසන්ගේ නිදහස් බිමක් වන 'හේම' කූටය"

රජු: "ඕ-හෝ-එහෙමද? ඒ පර්වතයට බැහැල තවුසන්ට වැඳල යන්ට අත්නම් (සිනා සී) මේ අහස් ගමන කොච්චර සනීපද? දූලි වැදීමකුත් නැහැ. රෝද හඬකුත් නෑ-කිසිම හෙල්ලීමක්-පෙරලීමක් නැහැ."

මාතලී: "රජ තුමනි! ඔබගේත්, සක්දෙව් රජුගෙත්, වෙනස ඔච්චර තමයි."

රජු: "අර මරීචි ඍෂිවරයාගේ අසපුව තියෙන්නේ කොයි හරියෙද?"

මාතලී: "මෙන්න මේ හරියේ තමයි, ඒ අසපුව තියෙන්නේ."

රජු: "ඒ තවුසන්ට මගේ නමස්කාරය වේවා!"

මාතලී "මෙන්න මේ හරියේ තමයි මදර ගස් බහුලව වැඩුනු ප්‍රාජාපතිහුගේ ආශ්‍රමය තියෙන්නේ. අපි මේ ආශ්‍රමය වෙත යමු."

(රථය නවත්වයි)

මාතලී: "බහින්න, රජතුමනි"

රජු: "ඇයි ඔබ?"

මාතලි: ''රජ තුමනි, මා සක්දෙව් රජ හමුවී එනතුරු ඔබ තුමා ඔය අශෝක ගස යටට වී සිටින්න.''

රජු: (සිත් යොමු කරමින්) 'කව්ද? මේ පොඩි ළමයෙකු වළක් වන්නේ? එකත් එකට මේ පොඩි ළමයින් පසු-පස එන තවුසියන් වගයක් වගෙයි''

දරුවා: ඇරපන් සිංහයෝ තොගේ කට, මට තොගේ දත් බලන්න.''

ප්‍රථම තවුසිය: ''අනේ, මේ ළමයා වගේ හිතුවක්කාරයෙක්. මේ සතාටවත් ඉන්න දෙන්නේ නැති හැටි. ඍෂිවරු අතර ඉදලත් මේ ළමයාට බැරිවුනා නොව බියක් නැතුව ඉන්න ඉගෙන ගන්න.''

(රජුට මේ දරුවා කෙරෙහි මහත් ආලයක් ඇති වෙයි)

ද්විතීය තවුසිය: ''අනේ දරුව නිකම් ඉන්න. ඔය සිංහ පැටියා අල්ල ගෙන ඉන්නකොට අර සිංහ ධෙනුව පනියි පුතාගෙ ඇඟට.''

දරුවා: ම්-ම් ම්-ම් මම බය නෑ. මගෙ පැටියෝ!.........''
(දරුවා තොල දිගු කරයි.)

රජු: (තමාටම කියා ගනී) මේ ළමයා හරියට මහත් තේජසක බීජයක් වගෙයි. මහා ගින්නක් ඇති කිරීමට සමත් කුඩා ගිනි පුපුරක් වගෙයි.''

ප්‍රථම තවුසිය: ''අනේ පුතා, ඔය සිංහ පැටියා අත හරින්න. පුතාට දෙනවනේ වෙනින් හොඳ සෙල්ලම් බඩුවක්.''

දරුවා: ''කෝ ඒක දෙන්න.'' (ළමයා අත දිගු කරයි)

රජු: (ළමයාගේ අත්ල දෙස බලමින්) ''ඕ-මේ සක්විති පුතෙක් නොවැ. අර අතෙහි ලස්සන වලින් මේක පැහැදිලිය., අර කෝමල ළපටි අත උදෑසනම පිපුණු රතු නෙළුම් මලක් වගෙයි.''

**ද්විතීය තවුසිය:** "සුව්‍රතා! අනේ මේ දරුවා කීමෙන් විතරක් වළක්වන්න බැහැ. ඔයා ගිහින් ගේන්නකො අර අසපුවෙ තියෙන මාර්කණ්ඩ සෘෂි කුමාරයාගේ මැටිවලින් හදපු මොනරා."

**ප්‍රථම තවුසිය:** "හොඳයි, හොඳයි, මම යන්නම්." (නික්ම යයි)

**දරුවා:** "මම ඒ මොනරා ගේනකම් මේ සිංහ පැටියාත් එක්ක සෙල්ලම් කරණවා." (දරුවා තවුසිය දෙස බලා සිනාසෙයි)

(තවුසිය රජු දකියි)

**තවුසිය:** "කරුණා කරලා අනේ මෙහෙ එන්න. මේ සිංහ පැටියා මේ ළමයාගෙන් මුදවන්න"

**රජු:** (සිනාසෙමින් දරුවා වෙත යයි.) ඔය මොකෝ මහර්ෂි පුත්‍රය."

**තවුසිය:** "මහත්මාණෙනි! ඔය මහාර්ෂි පුත්‍රයෙක් නොවෙයි. (තවුසිය දරුවා දෙසත් රජු දෙසත් බලමින්) හරි පුදුමයි නේ."

**රජු:** "ඒ මොකෝ එහෙම කියන්නෙ"

**තවුසිය:** "එහෙම කියන්නේ, ඔය දෙන්නාම හරියට එකම වගෙ නිසයි."

**රජු:** හොඳයි සෘෂිකුමාරයෙක් නොවෙයි නම් මේ කුමාරයාගේ වංශය කුමක්ද?"

**තවුසිය:** "කුරු වංශය"

**රජු:** (තමාටම) "මගේම වංශය නේ. මේ තවුසියටත් පේනවා මා වගේම කියල. පෞරවයන්ගේ ජීවිත අවසානයේ සිරිතක් තියෙනව, පෞරව වංශික රජවරු තරුණ කාලයෙහි පොළොවෙහි ආරක්ෂාව සඳහා සම්පත් අනුභව කරමින් මහා මාලිගාවල වෙසෙනව, ඔහු මහලු කාලයෙහි වෘක්ෂ මූලයන් හා මහා වනයන් සිය වාස භවනයන් කරගන්නව, ඒ වුනාට මේ කුමාරයා කුඩා කාලෙම මේ වනගත වෙලා ඉන්නේ!"

තවුසිය: "මේ කුමාරයා ඇගේ මාතාව විසින් ප්‍රසූත කරණු ලැබුවේ මේ අසපුවෙහි දීම ය."

රජු: "එසේ නොවෙයි මට දැන ගන්න ඕනෑ මේ දරුවාගේ මව කවරෙකුගේ භාර්යාවක් ද කියන එක යි."

තවුසිය: "ඒ හදිසි පෙම්වතාගේ නම කියන්න පුළුවන් වන්නේ කාටද?"

(රජු දරුවාගෙන්ම මවගේ නම ඇසීමට සිත යි. මේ අතර අනෙක් තවුසිය මොනර රූවද රැගෙන පැමිණෙයි)

තවුසිය: "මේ බලන්න පුතා! මේ සකුන්ත ගේ (පක්ෂියා-ගේ) ලාවන්‍යය (ලක්ෂණ)."

කුමරු: "අනේ! කෝ අම්මා."

තවුසියන් දෙදෙනා: "අනේ බලන්න "සකුන්තලාවන්‍ය" කියන කොට අම්මාගේ නම මතක් වුන හැටි."

දෙවැනි තවුසිය: "එහෙම නොවෙයි, පුතාට කියන්න ඔය මොනාරගේ ලස්සන බලන්න කියල."

කුමරු: "හොඳයි, දෙන්න මට ඔය මොනරා."

මුලම තවුසිය: "දරුවා දෙස බලමින් කෝ මේ දරුවාගේ අතේ බැඳල තිබුනු ආරක්ෂක සූරේ"

රජු: "ඉක්මන් වෙන්න එපා. ඉක්මන් වෙන්න එපා. අර සිංහ පැටියත් එක්ක සෙල්ලම් කරණ කොට බිම වැටිල තිබුණ." (රජු බිම වැටී තිබුණ සූරය ගෙන තවුසියට දීමට සැරසෙයි.)

තවුසියන් දෙදෙනා: "හා අල්ලන්න එපා! කොහොමද ඕක ගත්තේ."

රජු: "ඇයි අල්ලන්න නරක?"

**ප්‍රථම තවුසිය:** "ඔය සුරේ මේ දරුවට ලැබුනේ රන්කිරි කට ගාන දවසේ කාශ්‍යප ඍෂිවරයාගෙන් මේ සුරය දරුවගේ මව් පියන් දෙදෙනාටත්-දරුවටත් හැර වෙන කෙනෙකුට අල්ලන්ට බැහැ"

**රජු:** හොඳයි වෙන කෙනෙක් ඇල්ලුවොත්."

**ප්‍රථම තවුසිය:** "සර්පයෙක් වෙලා දෂ්ට කරනවා."

**රජු:** "හොඳයි, එහෙම ඒවා වෙනව දැකල තියෙනවද?"

**තවුසියන් දෙදෙනා:** "ඔව් කීප වාරයක් ම දැකල තියෙනව."

(රජු දරුවා වැළඳ ගනියි.)

**විතීය තවුසිය:** සුව්‍රතා! එන්න යන්න. අපි මේ ප්‍රවෘත්තිය කියමු සකුන්තලාට' (තවුසියන් දෙදෙනා නික්ම යති.)

**දරුවා:** "අනේ අත හරින්න මට යන්න ඕනෑ, අම්ම ඉන්න තැනට."

**රජු:** "ඇයි පුතා! ආදරේ අම්මට විතරක්ද? මම පුතාගේ තාත්ත නෙ. ඇයි මට ආදරේ නැද්ද?"

**දරුවා:** "මගේ තාත්තා නොවෙයි ඔය. මගේ තාත්ත දුෂ්‍යන්ත රජු."

**රජු:** (සිනාසෙමින්) "ඔය විවාදෙන් වැඩක් නැහැ පුතා."

(සකුන්තලා පැමිණෙ යි.)

**රජු:** (සකුන්තලා දෙස බලා සුසුම් හෙළමින්) මේ සකුන්ත ලාමම යි." (තීරණය කරති)

**සකුන්තලා:** (පශ්චාත්තාපයෙන් කෘශවී ගිය රජ දැක) "දුෂ්‍යන්ත රජ කියල හිතන්න අමාරුයි. කව්ද මේ පුතාගේ ඇඟ අත ගාන්නේ."

**රජු:** "අහෝ ප්‍රියාව! එද ඔබ මට අමතක වුනා වගේ, අද ඔබට මා අමතක වෙනව වගෙයි."

සකුන්තලා: (තමාටම) ''ඕ-හෝ මේ දුෂ්‍යන්ත රජු වගෙයි.''
''ස්වාමි රාජයාණනි! ඔබට ජය වේවා!''

(දෙනෙතින් කඩා හැළුණු කඳුළු ධාරා වලින් ඇයගේ මුව වැසුනු නිසා හදිසියෙන් කතාව නතර වෙයි)

රජු: ''අහෝ සුන්දරිය! ඔබගේ ප්‍රිය හඬ කඳුළු වලින් වැසුනුවත් මම ජය ගතිමි.''

ළමයා: ''කවුද අම්මෙ ඒ?''

සකුන්තලා: ''පුතාගේ තාත්ත නෙ ඒ,''

රජු: (සකුන්තලාවගේ පාමුල වැටෙයි.) ''සුන්දරිය මා දැන ඔබ හදවතෙහි තිබුණු වැරදි හැඟීම් දුරලනු මැනවි. සිතෙහි මුලා වීම බලවත් දේකි. අන්ධ මිනිසා හිසෙහි පළඳවන ලද මල් මාලාව සර්පයෙකැයි සිතා විසි කරන්නාක් මෙන් බලවත් මුලාවට පැමිණි මිනිසා ද, සුභ දේද අ සුභ යයි සැළකීම සිරිතකි–සත්‍යයද අසත්‍ය යයි විශ්වාස කිරීම සිරිතකි.''

සකුන්තලා: ''රජ තුමනි! නැගිටින්න. නැගිටින්න. එය කර්ම බලයෙන් සිදු වූවක්. ඔබ විසින් එයට කළ හැකි දෙයක් නැත.''

රජු: ''නැගිටින්නම්'' (නැගිටියි)

සකුන්තලා: ''හොඳයි, දුඃඛිත වූ ඔබ තුමන්ට මා යළිත් සිහි වුනේ කෙසේ ද?''

රජු: ''සුන්දරිය නෙතින් ගිලිහෙන මේ කඳුළු ධාරා මගේ කොපුල් වලින් ඉවත් වුන විට එය කියන්නෙමි.''

සකුන්තලා: (රජු ගේ ඇඟිල්ලෙහි වූ මුද්ද දෙස බලමින්) ''රජ තුමනි! මේ ඔබේ මුද්දද?''

රජු: ''ඔව්, සුන්දරිය! මේ මුද්ද ලැබීමෙන් පසුවයි ඔබ මට සිහිවුනේ.''

සකුන්තලා: ''අහෝ! මේ මුද්ද කරපු කරදරේක මහත.''
(මාතලී පැමිණෙයි.)

මාතලී: "මේ සකුන්තලාගේත්, මේ පුත්‍රයාගේත් මුහුණු දකින්නට ලැබීම ඔබේ වාසනාවක්."

රජු: "ඔව් මගේ මනදෙල පිරුණා. මාතලිය මේ පුවත සක්දෙව් රජතුමාත් දන්නවාද?"

මාතලී: (සිනාසෙමින්) "සක්දෙව් රජ වැනි අයට මෙබඳු කරුණු කෙනෙකු විසින් කියන්නට ඕනෑ නැහැ. යමු අපි කාශ්‍යප ඍෂිතුමා ළඟට. එතුමා ඔබගේ දර්ශනය බලාපොරොත්තු වෙනවා."

රජු: "සකුන්තලා, අපි දරුවත් පෙරටු කරගෙන කාශ්‍යප ඍෂිවරයාද දකින්ට යමු."

සකුන්තලා: "අනේ මට ලැජ්ජයි ඔබත් සමග ගුරුදේවයන් ලඟට යන්න."

රජු: මේ මංගල සමයෙහි මේ අභිවෘද්ධි සමයෙහි එහෙම සිතන්ට එපා. අපි යමු."

(සියල්ලෝම යති.)

(අදිතිය සමග අසුන්ගෙන සිටි කාශ්‍යප ඍෂි තෙමේ තමාවෙත එළඹෙන රජු දකියි.)

කාශ්‍යප: "අදිතිය! ඔය එන්නේ දුෂ්‍යන්ත තමයි."

අදිතිය: 'ඔව්, ඔහුගේ ආකාරයට ම සම්භාවනා කටයුතුයි"

මාතලී: "රජතුමනි! අර බලන්න-දෙවියන්ගේද මව් පියන් වන අදිතියත්, කාශ්‍යප ඍෂිතුමාත් පුත්‍ර ප්‍රේමයෙන් ඔබ දෙස බලන හැටි"

රජු: "ඔව් මාතලී මටත් එය අවබෝධ වුනා. ශක්‍රයා වැනි බලසම්පන්නයන් පවා ඇති කොට තිබෙන්නේ මේ කාශ්‍යප වැනි ඍෂිවරුන් විසින් තමයි."

(රජු ඍෂිතුමන් වෙත පැමිණ නමස්කාර කරති.)

කාශ්‍යප: "දරුව බොහෝ කාලයක් නිදුකින් ජීවත් වේවා! සුවසේ පොළොව පාලනය කිරීමට අවසථාව ලැබේවා!'

අදිති: "දරුව! අප්‍රමාදව කටයුතු කරණු මැනවි."

සකුන්තලා: "මේ දරුවා සහිත මම ඔබතුමන්ගේ පා වදිමි."

කාශ්‍යප: "දුවේ! ඔබේ සැමියා ශක්‍රයා වැනි කෙනෙකි. ඔබට වෙන කෙනෙකුගෙ ආශීර්වාදයෙන් වැඩක් නැත. ඔබ දැන් [illegible] (ශක්‍රභාර්යාව) වැනිය."

අදිති: "දුවේ! සැමියාගේ අභිමතය අනුව කටයුතු කරණු මැනවි."

කාශ්‍යප: "ඔබ තුන් පොලගේ මේ හමුවීම සැබවින් ම [illegible]."

රජු: "ඔව්, ගුරුදේවයාණනි, මලකට අනතුරුව පලයක් ලැබෙන්නාක් මෙන් ඔබගේ ප්‍රසාදයෙන් මේ සියල්ල සිදු වුණු බව සැබවින්ම සත්‍යයකි. එහෙත් පසු ගිය කාලයෙහි මගේ සිත විකාරයට පත්ව තිබුණි. එහෙත් මේ මුද්ද දකිමෙන් පසු එය ප්‍රකෘතිමත් බවට පත් වුණේය. පසුගිය කාලයෙහි සිදුවීම් මට දැන් චිත්‍රයක් [illegible] වැටහෙයි."

කාශ්‍යප: "දරුව! තමා ගැන සැක නොසිතනු මැනවි. එහි හේතුව මම දැන් කියන්නම්."

රජු: "හොඳමයි ගුරුදේවයාණනි."

කාශ්‍යප: "වරක් මා ධ්‍යානයෙහි යෙදී සිටිද්දී මේනකා [illegible] හැසිරිය යුතු ක්‍රම නොදන්නා සකුන්තලාවත් කැටුව අදිතිය වෙත ගියා. එද දුර්වාශ සෘෂිතුමා කළ සාපයෙන් තමයි මේ සකුන්තලාව සිය සැමියාගෙන් වෙන්ව සිටීමට සිදුවුනේ. ඔය මුද්ද දකිමෙන් එම ශාපය අවසාන විය යුතුයයි අධිෂ්ඨාන කළේ එම සෘෂිතුමාය."

රජු: "ලෝකා'පවාදයෙන් මම මිදුනෙමි."

සකුන්තලා: "එද මගේ යෙහෙළියන් මේ මුද්ද පෙන්විය යුතුයයි කිවේ එනිසා තමයි."

කාශ්‍යප: "දුවේ, කෘතඥතාවය පළකරන්න. ගත වූ දේ සිහිකරමින් සැමියා කෙරෙහි කෝප නොකළ යුතුයි. දූවිලි වලින් වැසුනු කණ්ණාඩියෙහි පිළිබිඹුව නොපෙනෙන්නාක් මෙන් ශාපයෙන් වැසී ගිය සිතෙහි ස්මරණය පිළිබිඹු වන්නේ කෙසේද?

රජු: "එසේමයි ගුරුදේවයාණනි."

කාශ්‍යප: "මේ දරුවා දකින විට අපට ඇතිවන්නේ ලොකු සතුටකි."

රජු: "එසේය ගුරු දේවයාණනි, මගේ වංශය දැන් සවීරයි."

කාශ්‍යප: "මේ දරුවා අනාගතයෙහි සක්විත්තෙකු වෙනවා ඇත."

රජු: "ඔහුට ඔබ වහන්සේගේ ආරක්ෂාව ලැබේවා!"

කාශ්‍යප: "තවුස් බවෙහි ආනුභාවයෙන් ඒ සියල්ලම ඉටු වෙනවා ඇත. කව්ද මෙහි ඉන්නේ?" (ශිෂ්‍යයෙක් පැමිණෙයි.)

ශිෂ්‍යයා: "මම එන්නෙමි ගුරුදේවයාණනි."

කාශ්‍යප: "ගාලව! අර ඍෂිවරයා වෙත ගොස් කියන්න පුත්‍රයා සහිත සකුන්තලාව දුෂ්‍යන්ත විසින් නැවත හඳුනා ගැනීමෙන් පසුව පිළිගත් බව."

ශිෂ්‍යයා: "හොඳමයි ගුරුදේවයාණනි."

(ශිෂ්‍යයා නික්ම යයි)

කාශ්‍යප: "දරුව, මේ පුත්‍රයත් භාර්යාවත් කැටුව ශක්‍රයාගේ රථයට නැගී දැන් ඔබගේ රාජධානියට යන්න."

රජු: හොඳමයි ගුරුදේවයාණනි."

(සියල්ලෝම නික්ම යති.)

**මහාකවි කාලිදස විසින් ලියන ලද අභිඥන ශාකුන්තලා නාම මාහැඟි නාට්‍යය මෙතෙකින් පරිසමාප්තයි.**



